# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,089 - 2018 සැප්තැම්බර් මස 14 වැනි සිකුරාදා - 2018.09.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

### තනතුරු ඇබෑර්තු

**අධිකරණ සේවා කොමිෂන් සභාව**

පහත උපලේඛනයේ සඳහන් ප්‍රදේශවල කාති තනතුරු සඳහා බඳවාගැනීම පිණිස මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අයදුම්පත් කැඳවීම

පහත සුදුසුකම් ඇති පුද්ගලයින්හට මේ සඳහා අයදුම් කළ හැක.

අයදුම්කරු මුස්ලිම් පුරුෂයෙකු විය යුතු අතර, පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියෙකු හෝ ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක් විසින් ප්‍රදානය කරන ලද සහතිකයක් දරන මෞලවි කෙනෙකු හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අල් - ආලිම් සහතිකයක් දරන්නෙකු හෝ නීතිඥයෙකු හෝ ඊට සමාන වෘත්තීමය සුදුසුකම් දරන්නෙකු හෝ විශ්‍රාමික රජයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතුය.

දැනට රාජ්‍ය සේවයේ නියුක්තයෙකුට මේ සඳහා අයදුම් කළ නොහැක.

අයදුම්කරු වයස අවුරුදු 40ට වැඩි, මනා ශාරීරික යෝග්‍යතාවයෙන් යුත්, යහපත් චරිතයක් ඇති, මුස්ලිම් විවාහ සහ දික්කසාද පිළිබඳව විශේෂිත වූ ඉස්ලාම් නීතිය ගැන හොඳාකාර දැනීමක් ඇති සහ සමාජය තුළ යහපත් පිළිගැනීමක් ඇති විවාහකයෙක් විය යුතුය.

තෝරාගනු ලබන අපේක්ෂකයා පත්වීම් ලිපියේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් සඳහා පත්කරනු ලැබේ.

කාතිවරයෙකු තමා පත්කරනු ලබන ප්‍රදේශය තුළ ස්ථිරව පදිංචි වී සිටීම නීතිමය වශයෙන් අවශ්‍යය.

කාතිවරයාට මසකට රුපියල් 7,500ක දීමනාවකට අමතරව සහායක සේවාවන්, ලිපිද්‍රව්‍ය හා තැපැල් වියදම් සඳහා මසකට උපරිම රුපියල් 6,250 ක ගෙවීමක් කරනු ලැබේ.

මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව සැකසූ අයදුම්පත්, ලියුම් කවරයේ වම් පස ඉහල කෙළවරේ "ක්වාසි" යනුවෙන් සඳහන් කර 2018 ඔක්තෝබර් මස 14 වෙනි දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් මා වෙත ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත් සමඟ ලිපි ලේඛනාදියෙහි මුල් පිටපත් එවිය යුතු නොවේ.

ආනන්දි කනගරත්නම්,
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය,
තැ. පෙ. - 573,
කොළඹ - 12.

2018 අගෝස්තු මස 23 වැනි දින.

01. *කොළඹ බටහිර* .- කොළඹ අධිකරණ කලාපයේ දෙහිවල, ගල්කිස්ස, රත්මලාන, නුගේගොඩ, පැපිලියාන, මහරගම, පන්නිපිටිය, හෝමාගම, පොල්ගස්ඕවිට, ඉංගිරිය, රාජගිරිය, බත්තරමුල්ල සහ අතුරුගිරිය යන ප්‍රදේශවල කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

**1965 අංක 1 සහ 1969 අංක 32 දරන මුස්ලිම් විවාහ හා දික්කසාද පනත්වලින් සංශෝධිත මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 වැනි පරිච්ඡේදය යටතේ) ක්වාසිවරයෙකු පත්කිරීමේ ඉල්ලුම් පත්‍රය**

**ක්වාසි බල ප්‍රදේශය :-**

1. මුලකුරු සමග නම

උ: අබ්දුර් රහ්මාන් එම්. අයි.

2. සම්පූර්ණ නම:

උ: මුහම්මදු ඉස්හාක් අබ්දුර් රහ්මාන්

3. ස්ථිර පදිංචිය :
4. ලිපිනය :
5. උපන් දිනය :
6. වයස :
7. ජාතිය :
8. ආගම :
9. ජා. හැ. ප. අංකය :
10. දුරකතන අංකය :
11. අධ්‍යාපන සුදුසුකම් :
    1. ..................................................
    2. ..................................................
    3. ..................................................
    4. ..................................................
    5. ..................................................
12. වෘත්තීය සුදුසුකම් :
    1. ..................................................
    2. ..................................................
    3. ..................................................
    4. ..................................................
    5. ..................................................
13. කියවීමට හා ලිවීමට හැකි භාෂාවන් :
14. මුස්ලිම් නීතිය පිළිබඳ දැනීමක් තිබේද : ඔව් / නැත
15. විවාහකද ? ඔව් / නැත
16. භාර්යාව ජීවත්ව සිටීද? ඔව් / නැත
17. ඉහත දී කරන ලද සහ දැනට කරන රක්ෂා (දිනත් සමග)

| සිට | දක්වා | රැකියාව | ස්ථානය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

18. ඉල්ලුම්කරු සතු දේපල වටිනාකම: රු.
19. මාසික ආදායම : රු.
20. කොපමණ ණය ගැතිද, ඇතොත් : රු.
21. පසුගිය අවුරුදු 10 තුළ ඔබ ක්‍රියාකාරීව දේශපාලන කටයුතුවල නිරතව සිටියේද ? ඔව් / නැත
22. ඔබ ආදායම් බදු ගෙවන්නෙක්ද ? ඔව් / නැත
23. ඔබට එරෙහිව අධිකරණයක අපරාධ නඩු තිබුනේ ද ? තිබේද ? ඔව් / නැත
24. උසාවිවලින් දඬුවම් ලබා ඇතොත් ඒවායේ විස්තර :
25. පෞද්ගලික තොරතුරු විමසිය හැකි අය (ඒ අය ඔබව හොඳින් දන්නා වග කිවයුතු පුද්ගලයින් විය යුතුය) :

| | |
|---|---|
| නම : | නම : |
| ලිපිනය : | ලිපිනය : |
| දුරකථන අංක : | දුරකථන අංක : |
| රැකියාව : | රැකියාව : |
| ඔබ දැන සිටි කාලපරිච්ඡේදය : | ඔබ දැන සිටි කාලපරිච්ඡේදය : |

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බැව් සහතික කරමි.

______________________, ඉල්ලුම්කරුගේ අත්සන.

______________________, දිනය

***සටහන :***
සියලුම සහතිකයන්හි පිටපත් ද මෙයට අමුණන්න.

09-271


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 ඔක්තෝබර් මස 05 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 සැප්තැම්බර් මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2018 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය**

ISO තත්ත්ව සහතිකයෙන් පිදුම්ලත් ආයතනයකි

විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු සහ උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය

**ග්‍රැෆික්ස්, මල්ටිමීඩියා සහ මුද්‍රණ පාඨමාලා - 2018**

රජය සහ පෞද්ගලික අංශය පිළිගත් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා හදාරා රැකියා සුලබ ග්‍රැෆික්ස්, මල්ටිමීඩියා සහ මුද්‍රණ ක්ෂේත්‍රයන්ට පිවිසෙන්න.

**පාසල් හැරගිය සිසුන් සඳහා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණකරණය පිළිබඳ පූර්ණ කාලීන NVQ පාඨමාලාව**
NVQ Training Programme in Offset Lithopress Operation for School Leavers (Full Time)

අද දිවයිනේ ඉහළ රැකියා ඉල්ලුමක්ව පවතින ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ පූර්ණ කාලීන පාඨමාලාවක් වන මෙම පුහුණු වැඩසටහන තුළින් ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography) Sheet Fed සහ Stream Feeder ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියා කරවීම ඇතුලු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදාළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව ලබාදේ. පුහුණුව අවසාන කිරීමෙන් පසු ඔවුන් රැකියා සඳහා අනුයුක්ත කෙරේ.

පාඨමාලා කාලය : මාස 14යි (පූර්ණ කාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 22,500

**මයික්‍රොසොෆ්ට් ඔෆීස්** - Microsoft Office

මෙම පාඨමාලාව තුළින් MS Office පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ පුහුණුවක් ලබා දෙන අතර පරිගණක භාවිතය පිළිබඳව ද මූලික දැනුම හා අවබෝධය ද ලබා දේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය නවකයන්ට මෙන්ම ආයතනවල රැකියාවන්හි නියුතු පුද්ගලයන්ට ද MS Office පිළිබඳව පූර්ණ දැනුම හා අවබෝධය ලබා දේ.

කාලයඃ මාස 04යි (අර්ධ කාලීන) මාධ්‍යඃ සිංහල හා ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 12,500

**පරිගණක ආශ්‍රිත ග්‍රැෆික් නිර්මාණකරණය** - Computer Graphic Design

ග්‍රැෆික්, මුද්‍රණ සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන ලෙස මෙම පාඨමාලාව සකස් කර ඇති අතර ඒ තුළින් අද ග්‍රැෆික් නිර්මාණයට අවශ්‍ය සියලු මෘදුකාංග පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දෙයි. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ නියැළෙන පුද්ගලයන්ට මනා දැනුම ද, පුහුණුව ද ලබා දේ.

**කාලයඃ මාස 05 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ ඉංග්‍රීසි**

පාඨමාලා ගාස්තුව : ආයතනික සහතිකපත් පාඨමාලාව රු. 17,000.00 NVQ සහතිකපත් පාඨමාලාව රු. 21,500.

**පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පිටු සැකසීම** - Computer Typesetting and Layout Design

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මුද්‍රණ, ග්‍රැෆික්, ප්‍රචාරක හා ප්‍රකාශන ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස්වන අතර ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ හා ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුනු පාඨමාලාවකි.

කාලයඃ මාස 05යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 13,500

**වෙබ් අඩවි නිර්මාණය** - Web Designing

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ නවීන තාක්ෂණයට අනුකූලව පුළුල් අවබෝධයක් සහ පුහුණුවක් ලබා දේ. පරිගණක ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට හා මෙම ක්ෂේත්‍රයට ඇතුළත් වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

කාලයඃ මාස 04යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 16,500

**අරේඛිය සංස්කරණය** - Non Linear Editing

මෙම පාඨමාලාව තුළින් රූපවාහිනී වැඩසටහන් සංස්කරණය සහ පිටපත් රචනය පිළිබඳ පූර්ණ ප්‍රායෝගික සහ න්‍යායාත්මක අවබෝධය ලබාදේ. පාසැල් හැරගිය සිසුන්ට ද වීඩියෝ, රූපවාහිනී, චලන රූප කර්මාන්තයේ සහ ඉලෙක්ට්‍රොනික් සන්නිවේදන හා චිත්‍රපට කර්මාන්තයේ නිරතවූවන් හටද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

කාලය : වසරයි. (අර්ධ කාලීන) මාධ්‍යඃ සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 23,000

**ත්‍රිමාණ සජීවිකරණය** - Digital Animation

මෙම පාඨමාලාව තුළින් පරිගණක ආධාරයෙන් ද්විමාන සහ ත්‍රිමාණ චලන රූප නිර්මාණකරණය කිරීම සහ එම රූප, රූපවාහිනි සහ චිත්‍රපට මාධ්‍ය සඳහා යොදා ගන්නා අයුරු සවිස්තරාත්මකව පුහුණු කෙරේ.

කාලය : මාස 06යි (අර්ධ කාලීන) මාධ්‍යඃ සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 23,000

**පරිගණක දෘඩාංග එකලස් කිරීම සහ සැකසීම** - Computer Hardware and Assembly

මෙම පාඨමාලාව තුළින් පරිගණක දෘඩාංග/මෘදුකාංග සහ පරිගණක එකලස් කිරීම පිළිබඳව මනා දැනුමක් සහ අවබෝධයක් ලබාදෙන අතර, එදිනෙදා පැනනගින දෘඩාංග/මෘදුකාංගවල අදාළ තාක්ෂණික හා ප්‍රායෝගික ගැටලු විසඳා ගැනීමට මහත් සේ මෙම පාඨමාලාව ප්‍රයෝජනවත් වේ. නවකයන්ට මෙන්ම පරිගණක තාක්ෂණයේ නියැලි පුද්ගලයන්ට ද මෙම පාඨමාලාව එකසේ ප්‍රයෝජනවත් වනු ඇත.

කාලය : මාස 04යි (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 12,500

**මුද්‍රණය සඳහා ග්‍රැෆික්ස් නිර්මාණ සැකසුම** - Design for Print

මුද්‍රණ රටා නිර්මාණකරණයේ දී ප්‍රයෝගිකව මුහුණ දෙන ගැටලු මෙන්ම රටා නිර්මාණකරණ සංකල්ප පිළිබඳව පුළුල් අවබෝධයක් හා දැනුමක් මේ තුළින් ලබාදේ. පරිගණක ග්‍රැෆික්ස් නිර්මාණ ජාත්‍යන්තර මට්ටමට නිර්මාණය කර ඒවා මුද්‍රණයට සුදුසු ලෙස සකසන අයුරු මෙම පාඨමාලාව තුළින් මැනවින් පැහැදිලි කෙරේ.

පාඨමාලා කාලය : වසර 1 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 15,500

**පොත් බැඳීම හා නිමාකරණය** - Book Binding and Finishing

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් ඇත. මේ තුළින් පොත් බැඳීම, නිමාව පිළිබඳ පුළුල් අවබෝධයක් හා න්‍යායාත්මක පුහුණුවක් ලබාදේ. මෙම පාඨමාලාව පාසැල් හැරගිය සිසුන්ට මෙන්ම ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට ද මහත් ප්‍රයෝජනයක් වේ.

කාලය : මාස 07යි (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 19,000

**Advanced Diploma in Printing Technology and Management**

කාලය : අවුරුදු 2 මාධ්‍ය : ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 140,000

**Advanced Diploma in Visual Communication and Management**

කාලය : අවුරුදු 2 මාධ්‍ය : ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 140,000

ඉහත උසස් ඩිප්ලෝමාවන් දෙක කොළඹ විශ්ව විද්‍යාලය හා එක්ව ආරම්භ කරන අතර, එය කොළඹ විශ්ව විද්‍යාලයේ MBA උපාධියට ඇතුළත්වීමට අවශ්‍ය මූලික සුදුසුකම් සපුරාලයි.

**නොමිලේ සහභාගි විය හැකි සම්මන්ත්‍රණ මාලාවක්**

ෆ්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා තාක්ෂණය සහ ඊට අදාළ මෘදුකාංග (Software) භාවිතය පිළිබඳව නොමිලේ සහභාගිවිය හැකි සම්මන්ත්‍රණයක් සැප්තැම්බර් මස 13 වැනි බ්‍රහස්පතින්දා උදේ 8.30 සිට සවස 1.30 දක්වා පැවැත්වෙන අතර, පොත් බැඳීම හා නිමාව පහදාදීම පිළිබඳ නොමිලේ සම්මන්ත්‍රණයක් සැප්තැම්බර් මස 14 වැනි සිකුරාදා උදේ 8.30 සිට සවසට 1.30 දක්වා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ ශ්‍රවණාගාරයේ දී පැවැත්වේ. ඉඩකඩ සීමිත නිසා 011 2686162 හෝ 011 2679791 දුරකතන අංක අමතා ආසනයක් හැකි ඉක්මනින් වෙන්කරවා ගන්න.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා සියල්ල උසස් ප්‍රමිතියකට අනුව ක්ෂේත්‍රයේ රැකියාවලට ගැළපෙන අයුරින් සකස් කොට ඇති අතර, පාඨමාලා සාර්ථකව නිමකරණ සිසුන් හට රජය හා ජාත්‍යන්තරව පිළිගත් වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ.

පාඨමාලා අධ්‍යක්ෂ,
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය.

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.

දුරකතන : 011 2686162, 011 2679791.

ෆැක්ස් : 011 2686162 ඊ-මේල් : sliopdir@sltnet.lk වෙබ් අඩවිය : www.sliop.edu.lk

ශාඛා :- ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ.

දුරකතන අංක : 066-2222172, 071 0554298.

09-222

---

**විද්‍යා තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

**කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය - මොරටුව**
**පූර්ණ කාලීන පාඨමාලාවන් සඳහා ආධුනිකයින් බඳවා ගැනීම**
**(සතියේ දින දිවා කාලීන කණ්ඩායම සහ සතියේ දින සන්ධ්‍යා හා සති අන්ත කණ්ඩායම)**

ශ්‍රී ලංකා ජර්මන් ඒකාබද්ධ ව්‍යාපෘතියක් වන මොරටුව කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනයෙහි (IETI) පහත සඳහන් පාඨමාලා හැදෑරීම සඳහා තරුණ තරුණියන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

1. **පවත්වනු ලබන පාඨමාලා :**

| | *පාඨමාලා විස්තර* | *ජාතික වෘත්තීය සුදුසුකම්* (NV Q ) | *කාලය* |
|---|---|---|---|
| | 01, 02, 03 වෘත්තීන් සඳහා අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ගණිතය හෝ විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයක් සමග අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී සිංහල භාෂාව, ගණිතය සහ විද්‍යාව සමග විෂයයන් 6ක් සමත් වී තිබීම හෝ අ.පො.ස. (උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය හෝ තාක්ෂණය සඳහා විද්‍යාව යන විෂයයන් 2න් එක් විෂයකට සාමාර්ථයක් ලබා තිබීම හා අ.පො.ස. (සා.පෙළ) සිංහල භාෂාව, විද්‍යාව සහ ගණිතය ඇතුළුව විෂයයන් 6ක් සමත් වී තිබීම. | | |
| 01. | **ඉලෙක්ට්‍රොනික් කාර්මික ශිල්පී (විශේෂ)** (Basic Work Shop practice, Domestic Installation, Analog ) Digital Electronic, Industrial Electronic, PLC, Micro Controller, \|"PIC", ARDUINO & Project Works ) | - | අවු. 03 |
| 02. | **විදුලි කාර්මික ශිල්පී (විශේෂ)** ගෘහස්ථ හා කර්මාන්තශාලා විදුලි පරිපථ, විදුලි මිනුම් උපකරණ, ගෘහස්ථ/කර්මාන්තශාලා ආරක්ෂක හා සන්නිවේදන පද්ධති වායු පාලන තාක්ෂණය, ඡබඝ තාක්ෂණය, මයික්‍රොකොන්ට්‍රෝලර් ප්‍රෝගැමින්, ඩිජිටල් ඉලෙක්ට්‍රොනික්ස්, ඔටෝමේෂන් පද්ධති | 4 වන මට්ටම | අවු. 03 |
| 03. | **ඉදිකිරීම් සුපරීක්ෂක** (Construction Management, Surveying & Leveling, Road Construction, Auto Cad, Quantity Surveying, Building Drawing & Estimate) ක්ෂේත්‍රයේ දුවැන්ත සමාගම් සමග වැඩබිම් පුහුණුව | 4 වන මට්ටම | අවු. 01 1/2 |
| | **04, 05 වෘත්තීන් සඳහා අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී සිංහල භාෂාව, ගණිතය ඇතුළුව විෂයයන් 6කින් සමත් වීම.** | | |
| 04. | **ශීතකරණ හා වායු සැකසුම් කාර්මික ශිල්පී** සියලුම වර්ගයේ ශීතකරණ, ගෘහස්ත හා කර්මාන්තශාලා වායු සමන පද්ධති | 4 වන මට්ටම | අවු. 02 |
| 05. | **යන්ත්‍ර කාර්මික ශිල්පී (විශේෂ) - Machinist (Special)** CNC Programming, CNC Machining, EDM Process, Wire cutting Process, Leaser Cutting, Solid work, Auto Cad | 4 වන මට්ටම | අවු. 03 |
| | 06 වෘත්තීය සඳහා අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී සිංහල භාෂාව, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් 6කින් සමත් වීම සහ මූලික පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම. | | |
| 06. | **පරිගණක චිත්‍ර නිර්මාණ ශිල්පී** (Adobe Photoshop, Illustrator, Adobe InDesign, Coral Draw, Printing & Scanning Mathod) | 4 වන මට්ටම | අවු. 01 |
| | **07, 08, 09, 10, 11 වෘත්තීන් සඳහා අවම වශයෙන් අ.පො.ස. (සා.පෙළ) දක්වා අධ්‍යාපනය ලැබීම.** | | |
| 07. | පෑස්සුම් ශිල්පී (විශේෂ) - Welder (Special) (MMA/GAS/TIG/MIG/MIG/FCAW/PLASMA/SPOT/STUD Welding ශිල්පීය ක්‍රම, Destructive & Non Destructive Testing Methods, Plate & Pipe Weld) | 4 වන මට්ටම | අවු. 03 |
| 08. | ජලනල කාර්මික ශිල්පී දැනට කර්මාන්ත ක්ෂේත්‍රයේ භාවිතා වන PVC, CPVC, GI, PB, PPR හා HDPE නල වර්ග But fusion, Heat fusion yd Electro fusion වැනි අති නවීන තාක්ෂණික ක්‍රමෝපාය භාවිතා කරමින් සම්බන්ධ කිරීම, නවීන සනීපාරක්ෂක උපාංග ස්ථාපනය, ජල පොම්ප ස්ථාපනය, උණුසුම් ජලනල පද්ධති ස්ථාපනය කිරීම සහ සැලසුම් නිර්මාණය හඳුනාගැනීම සහ ඇස්තමේන්තු සකස් කිරීම | 4 වන මට්ටම | අවු. 02 |
| 09. | පොත් බඳින්නා කොළ වර්ග හඳුනා ගැනීම/ නැවීම, විවිධ මැහුම් ක්‍රම හඳුනා ගැනීම, පොතක පිටු එකතු කිරීම/කටු ගැසීම, පිටු අංකනය/ පොත් වයර් කිරීම, පිටු කවර සැකසීම, ලෙජර් පොත මැසීම/ කවරය සෑදීම, පොත් සංරක්ෂණය | 4 වන මට්ටම | අවු. 01 1/2 |
| 10. | බහු කුසලතා ඉදිකිරීම් ශිල්පී පෙදරේරු/ජලනල/ලී වැඩ/විදුලි/වායු සමීකරණ පද්ධති/වෑද්දුම් සහ පිරිසැකසුම් වැඩ | 4 වන මට්ටම | අවු. 02 |

| | පාඨමාලා විස්තර | ජාතික වෘත්තීය සුදුසුකම් (NV Q ) | කාලය |
|---|---|---|---|
| 11. | දැව කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ)<br><br>නවීන යන්ත්‍ර පරිහරණය හා නඩත්තුව, යන්ත්‍ර තල මුවහත් තැබීම, ලී භාණ්ඩ නිමහම් කිරීම | 4 වන මට්ටම | අවු. 02 |
| 12 වෘත්තීය සඳහා අවම වශයෙන් 09 වන වසර දක්වා අධ්‍යාපනය ලැබීම | | | |
| 12. | ඉදිකිරීම් ශිල්පී (පෙදරේරු)<br><br>සැලසුම් ඇඳීම, මට්ටම් ගැනීම, ඇස්තමේන්තු කිරීම හා විවිධ අත්තිවාරම් වර්ග, ගඩොල් බැමි වර්ග, ආරුක්කු තාක්ෂණය, නවීන තාක්ෂණයට විවිධ යන්ත්‍ර සූත්‍ර භාවිතය. | 4 වන මට්ටම | අවු. 01 |
| 13, 14 වෘත්තීන් සඳහා අවම වශයෙන් අ.පො.ස. (සා.පෙළ) දක්වා අධ්‍යාපනය ලැබීම | | | |
| 13. | ඇලුමිනියම් පිළිසකරකරු<br><br>දොර සහ ජනෙල්, අභ්‍යන්තර වෙන් කිරීම, සිවිලින්, ඉනිමන්, රොලර්, ෂටර්, පදම් කළ වීදුරු සවිකිරීම, බිත්ති ආවරණ (Cladding) | 4 වන මට්ටම | අවු. 01 |
| 14. | දැව කාර්මික ශිල්පී (ගොඩනැගිලි)<br><br>රාමු වැඩ, ශටරින් වැඩ, දොර ජනෙල් රාමු සහ පියන්, සිවිලිම, ලැලි ඇතිරීම, වහල, පඩිපෙල, මුක්කු ලෑම, බෙදුම් බිත්ති | 4 වන මට්ටම | අවු. 01 1/2 |

2. වයස : 2018.10.01 වැනි දිනට වයස අවුරුදු 16ට නොඅඩු විය යුතුය.

03. පාඨමාලාවන් පවත්වනු ලබන වේලාවන් :

- සතියේ දින දිවා කාලීන කණ්ඩායම
  අංක 01 සිට 12 දක්වා ඇති වෘත්තීන් - සතියේ දිනවල පෙ.ව. 8.00 සිට ප.ව. 3.45 දක්වා.
- සතියේ දින සන්ධ්‍යා හා සති අන්තයේ කණ්ඩායම
  අංක 01 සිට 09 සහ 13, 14 දක්වා ඇති වෘත්තීන් - සතියේ දිනවල ප.ව. 4.00 සිට ප.ව. 7.00 දක්වා ද සති අන්තයේ සෙනසුරාදා සහ ඉරිදා දිනයන් හි පෙ.ව. 8.00 සිට ප.ව. 5.00 දක්වා පැවැත්වේ.

04. පුහුණුව පිළිබඳ විස්තර :

4.1 සියලුම පාඨමාලා ද්විත්ව පුහුණු ක්‍රමය මත සැලසුම් කර ඇත. ඒ අනුව වෘත්තීය පුහුණුවේ පළමු භාගයේ දී මූලික පුහුණුව ආයතනය තුළ දී ලබාදේ. පුහුණුවේ දෙවන භාගයේදී වැඩිදුර පුහුණුව සඳහා රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල කර්මාන්තශාලා වලට අනුයුක්ත කරනු ලැබේ. සියලුම වෘත්තීන් සඳහා දේශීය හා විදේශීය රැකියා අවස්ථාවන් අතිශයින් වැඩි වී ඇත.

05. තෝරා ගැනීමේ ක්‍රමය :

සම්මුඛ පරීක්ෂණයක් මගින්

06. අයදුම්පත් එවිය යුතු ආකාරය :

6.1 පහත දක්වා ඇති ආකෘතියට අනුව 11 1/2x8 1/4" (A4) ප්‍රමාණයේ කඩදසියක පිළියෙල කරගත් හෝ www.naita.gov.lk වෙබ් අඩවියෙන් ලබාගත් ඉල්ලුම්පත් 2018.10.01 දිනට පෙර අධ්‍යක්ෂ/ විදුහල්පති, කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය, නො. 581, ගාලු පාර, කටුබැද්ද, මොරටුව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ "ආධුනිකයින් බඳවා ගැනීම" යන්න සඳහන් කළ යුතු අතර, ඔබගේ ලිපිනය සඳහන් මුද්දර ගැසූ දිග ලියුම් කවරයක් ඔබගේ ඉල්ලුම්පත සමග එවිය යුතුය.

6.2 එක්අයදුම්කරුවෙකුතමන්කැමතිපාඨමාලාතුනකනම්ප්‍රමුඛතාවයඅනුවඅනුපිළිවෙලින්ඉල්ලුම්පතේසඳහන්කළ යුතු ය.

6.3 ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ පූර්ණ කාලීන පාඨමාලාවක් දැනට හදාරණ අයට මේ සඳහා අයදුම්කළ නොහැක.

6.4 තැපෑලේදී නැතිවන හෝ ප්‍රමාද වන අයදුම්පත් සම්බන්ධයෙන් කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය වගකියනු නොලැබේ. ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත කල් ඇතිව ඉදිරිපත් කළ යුතුය.

වෛද්‍ය සාරාංග අලහප්පෙරුම,
සභාපති,
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය.

ආදර්ශ අයදුම් පත්‍රය (11 1/2x8 1/4" (A4) ප්‍රමාණයේ )

**ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය**
කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය - මොරටුව
ආධුනිකයින් බඳවා ගැනීමේ අයදුම්පත

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————. මයා/මිය/මෙනෙවිය.

02. මුලකුරු සමග නම :————.

03. ලිපිනය :————.

04. පදිංචිය (i) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
(ii) දිස්ත්‍රික්කය :————.

05. දුරකථන අංකය : නිවස :————. ජංගම :————.

06. උපන් දිනය :————.

07. ජාතික හැඳුනුම්පත් අංකය :————.

08. අධ්‍යාපන සුදුසුකම් (ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම X ලකුණින් සළකුණු කරන්න)

| | | | | | |
|---|---|---|---|---|---|
| අ.පො.ස. (උ. පෙළ) | | අ.පො.ස. (සා. පෙළ) | | 8 වන ශ්‍රේණිය | |

අ. පො. ස. (සා.පෙළ) ප්‍රතිඵල

| | විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

අ. පො. ස. (උ.පෙළ) ප්‍රතිඵල

| | විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

09. ඔබගේ සුදුසුකම් අනුව ඔබ විසින් හැදෑරීමට කැමති පාඨමාලා තුනක නම් ප්‍රමුඛතාවය අනුව අනුපිළිවෙලින් සඳහන් කරන්න.

| | |
|---|---|
| 01. | |
| 02. | |
| 03. | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බව සහතික කරමි.

.........................
අයදුම්කරුගේ අත්සන

.........................
දිනය

09-417

---

**විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය - ඔරුගොඩවත්ත
පූර්ණ කාලීන පාඨමාලාවන් සඳහා ආධුනිකයින් බඳවා ගැනීම
(සතියේ දින දිවා කාලීන කණ්ඩායම සහ සතියේ දින සන්ධ්‍යාකාලීන සහ සතිඅන්ත කණ්ඩායම)

ජපන් - ශ්‍රී ලංකා මිත්‍රත්වය මත ප්‍රදානය වූ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ පවත්වනු ලබන පහත සඳහන් පූර්ණ කාලීන පාඨමාලා සඳහා ආධුනිකයින් බඳවා ගැනීම පිණිස වයස අවුරුදු 16 ට නොඅඩු 25 ට නොවැඩි ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. අයදුම්පත් කැඳවනු ලබන පාඨමාලා

| අනු. අංක | පාඨමාලා | ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ ) | කාල සීමාව |
|---|---|---|---|
| අංක 1, 2, 3, 4 සඳහන් පාඨමාලා සඳහා අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයෙන් සිංහල, ගණිතය සහ විද්‍යාව ඇතුළුව දෙවතාවකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබීම. | | | |
| 1 | මෝටර් රථ කාර්මික ශිල්පී - Automobile Mechanic (Introduction of Basic measuring instruments, Repair and Maintenance of engine systems and chassy systems, Testing of vehicle wheel alignment, Vehicle systems diagnostic by using Analyzers and scanners, Technical English and Basic Computer Literacy) | 4 වන මට්ටම | අවු. 03 |
| 2 | මෝටර් රථ කාර්මික ශිල්පී - Automobile Electrician (Introduction of Basic Electricity, Basic Electrical circuits, Using of Electrical Measuring instruments, Basic Electronic Technology, Repairing of all electrical and electronic systems related to automotives and Automobile Audio/Video and Car Phone systems.) | 4 වන මට්ටම | අවු. 03 |
| 3 | යන්ත්‍ර ශිල්පී - Machinist (සී එන් සී (CNC) ප්‍රෝගෑමින්, කැම් (CAM) ප්‍රෝගෑමින්, ලේත් මැෂිනින් ඇතුලු මූලික යන්ත්‍රවලට අමතරව මෝටර් රථ ඉංජිනේරු ක්ෂේත්‍රයට අයත් හෙඩ් ෆේසින්, බෝරිං හෝනින්, ක්‍රෑන්ක් ග්‍රයින්ඩ් සහ ටූල් කටර් ග්‍රයින්ඩින් යන සියලුම යන්ත්‍රවල පුහුණුව ලබාදේ. | 4 වන මට්ටම | අවු. 03 |
| 4 | මෝටර් රථ වායු සමීකරණ කාර්මික ශිල්පී - Automobile A/C Mechanic (Introduction of Safety (Environmental and Personal), Basic Workshop Practice, Fundamentals of Air Conditioning systems, Dismantiling and Assembling of related A/C components, Introduction of A/C Electrical | 4 වන මට්ටම | අවු. 02 |
| | circuits and trouble shooting of Electrical circuits, Using of related modern equipment, Gas welding and Brazing, Computer Based Training for understanding/reading, CDs, manuals, flow charts and preparation of estimations) | 4 වන මට්ටම | අවු. 02 |
| අංක 05 පාඨමාලාව සඳහා රජයේ හෝ රජය විසින් පිළිගන්නා ලද පාසලක 8 වන ශ්‍රේණිය සමත්වී තිබීම. | | | |
| 5 | මෝටර් රථ ටින්කර් සහ පින්තාරු ශිල්පී - Automobile Tinker and Painter<br><br>(Basic workshop practice, Gas Welding, Arc Welding, Mig/ Mag Welding, Tig Welding, Introduction of Painting Materials, Identification of Body Damages and Preparation of damaged body surfaces, Mixing of colours, preparation of estimation, Technical English and Introduction of Computer Literacy.) | 4 වන මට්ටම | අවු. 03 |
| අංක 1, 2, 3, 5 සඳහන් පාඨමාලා සඳහා පාඨමාලාවල පළමු වසරේ ආයතනික පුහුණුවේ දී ලබාගත් න්‍යායික සහ ප්‍රායෝගික දැනුම සහ කුසලතාවය වර්ධනය කර ගැනීම සඳහා පාඨමාලාවේ දෙවන හා තුන්වන වසර කර්මාන්ත පුහුණුව සඳහා රජයට අනුබද්ධ හා නොවන මෝටර් රථ ක්ෂේත්‍රයේ කර්මාන්තශාලාවලට අනුයුක්ත කරනු ලැබේ.<br><br>අංක 4 සඳහන් පාඨමාලාව සඳහා පුහුණුවේ පළමු වසර ආයතනය තුළදී න්‍යායික සහ ප්‍රායෝගික පුහුණුව ලබාදෙන අතර ඉතිරි වසර කර්මාන්ත පුහුණුව සඳහා රජයට අනුබද්ධ හා නොවන මෝටර් රථ ක්ෂේත්‍රයේ කර්මාන්තශාලාවලට අනුයුක්ත කරනු ලැබේ. | | | |

2. **වයස :**

2018.10.01 වැනි දිනට වයස අවුරුදු 16ට නොඅඩු සහ 25ට නොවැඩි ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශ්වයටම අයදුම්කල හැක.

3. **පාඨමාලාවන් පවත්වනු ලබන වේලාවන් :**

*අංක 1, 2, 3, 4, සහ 5 සඳහන් පූර්ණ කාලීන පාඨමාලා සතියේ දින දිවා කාලයේ පැවැත්වේ.*

- සතියේ දින දිවා කාලය පූර්ණ කාලීන පාඨමාලා - පෙ. ව. 8.00 සිට ප. ව. 3.45 දක්වා

*අංක 1, 2, සහ 5 සඳහන් පූර්ණ කාලීන පාඨමාලා සතියේ දින සන්ධ්‍යාකාල සහ සතිඅන්තයේදී පැවැත්වේ.*

- සතියේ දින සන්ධ්‍යාකාල - ප. ව. 4.00 සිට ප. ව. 7.00 දක්වා
- සතිඅන්තයේ - සෙනසුරාද සහ ඉරිදා දිනයන්හි පෙ. ව. 8.00 සිට ප. ව. 5.00 දක්වා

4. **සහතිකපත් ප්‍රදානය :**
සාර්ථක ලෙස පුහුණුව අවසන් කර ජාතික වෘත්තීය සුදුසුකම් අවසාන ඇගයීම් පරීක්ෂණයෙන් සමත්වන ආධුනිකයින්ට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ජාත්‍යන්තරව පිළිගත් ''ජාතික වෘත්තීය සුදුසුකම් 4 වන මට්ටමේ සහතිකය'' සමග මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ සහතිකයද ප්‍රදානය කරනු ලබයි.

5. **පාඨමාලා සඳහා තෝරා ගැනීම :**
බඳවා ගැනීමේ අධ්‍යාපන සුදුසුකම් සපුරාලන සියලුම අයදුම්කරුවන් පැය 01ක අභියෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටිය යුතු අතර ඉන් ලබාගත් ලකුණුවල ප්‍රමුඛතාවය අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවා තෝරා ගැනීම සිදුකරනු ලබයි.

6. **අයදුම්පත් එවිය යුතු ආකාරය :**
මි. මී. 290 x මි. මී. 210 (A4) ප්‍රමාණයේ කඩදසියක පහත සඳහන් උපදෙස් හා ආකෘතිය අනුව පිළියෙල කරගත් අයදුම්පත, රු. 45 මුද්දරයක් ඇලවූ සහ ඔබගේ ලිපිනය සඳහන් දිග ලියුම් කවරයක් සමග මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ දෙමටගොඩ මහජන බැංකු ශාඛාවේ ගිණුම් අංක 071100103320674 දරන ගිණුමට විභාග ගාස්තු ලෙස රු. 300.00 ක් බැර කර ලබාගත් ලදුපත එම අයදුම්පතේ පසු පිටෙහි නොගැලවෙන සේ අලවා 2018 ඔක්තෝබර් මස 01 දිනට හෝ ඊට ප්‍රථම අධ්‍යක්ෂ/විදුහල්පති, මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය, අංක 69/ඒ, බේස්ලයින් මාවත, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ උඩ වම් කෙලවරේ ''ආධුනිකයින් බඳවා ගැනීම'' යනුවෙන් සඳහන් කළ යුතුය. අප ආයතනයට පැමිණද ඉල්ලුම්පත් නොමිලේ ලබාගත හැක. නැතහොත් අපගේ www.aeti.edu.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

අයදුම්පත සම්පූර්ණ කිරීමට උපදෙස් :

- අයදුම්කරුගේ අභිමතය පරිදි, ප්‍රමුඛතාවය ලබාදෙමින් පාඨමාලා තුනක් අයදුම්පතේ 10 වන ඡේදයේ සඳහන් කර අයදුම්කල හැකිය.
- ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ දැනට පුහුණුව ලබමින් සිටින අයට අයදුම් කළ නොහැක.
- තැපැලේදී අස්ථානගතවන හෝ ප්‍රමාදවන අයදුම්පත්වලට මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය වග නොකියන අතර සම්පූර්ණ කරන ලද අයදුම්පත් කල් ඇතිව එවන මෙන් දන්වා සිටිනු ලැබේ.
- වැඩිදුර තොරතුරු සඳහා ලේඛකාධිකාරී, දුරකථන අංක - 011-2572977 හෝ 011-2532182 විමසන්න.

වෛද්‍ය සාරංග අලහප්පෙරුම,
සභාපති,
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය.

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය,
අංක 971 ශ්‍රී විජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

**ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය**
මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය,
ආධුනිකයින් බඳවා ගැනීමේ අයදුම්පත.

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

01. මුලකුරු සමග නම :

| 02. ස්ත්‍රී | පුරුෂ |
|---|---|
| | |

03. සම්පූර්ණ නම :

| 04. උපන්දිනය : | වර්ෂය | මාසය | දිනය |
|---|---|---|---|
| | | | |

05. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

06. ලිපිනය :

දුරකථන අංකය : ජංගම :
ස්ථාවර :

ඊමේල් ලිපිනය :

07. පරිපාලන දිස්ත්‍රික්කය :

ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාසය :

08. අධ්‍යාපන සුදුසුකම් : (ලබා ඇති උසස්ම සුදුසුකම් x ලකුණ යොදන්න.)

| 8 වන ශ්‍රේණිය | | අ. පො. ස. (සා. පෙළ) | | අ. පො. ස. (උ.පෙළ) | |
|---|---|---|---|---|---|

09. අ. පො. ස. (සා.පෙළ.) විභාග ප්‍රතිඵල :

| | සමත්වූ විෂයයන් | සාමාර්ථය | වර්ෂය | | සමත් වූ විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|---|---|---|---|
| 1 | | | | 8 | | | |
| 2 | | | | 9 | | | |
| 3 | | | | 10 | | | |
| 4 | | | | 11 | | | |
| 5 | | | | 12 | | | |
| 6 | | | | 13 | | | |
| 7 | | | | 14 | | | |

අ. පො. ස. (උ.පෙළ.) විභාග ප්‍රතිඵල :

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | | | | 3 | | | |
| 2 | | | | 4 | | | |

10. තෝරා ගනු ලබන පාඨමාලාවන් පිළිවෙලින් :

| |
|---|
| 1 |
| 2 |
| 3 |

ඉහත සඳහන් කරුණු නිවැරදි බවත්, සත්‍ය බවත් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ දැනට පුහුණුවක් මා නොලබන බවත්, මෙයින් සහතික කරන අතර, මෙහි දක්වා ඇති කරුණු අසත්‍ය බවට අනාවරණය වුවහොත්, මම මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ පාඨමාලාව හැදෑරීම සඳහා නුසුදුස්සෙකු වන බවත් හොඳාකාරව දනිමි.

________,
අයදුම්කරුගේ අත්සන.

දිනය :________.

09-418

---

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 වන පන්තියේ ෂෂ ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018**

උක්ත තරග විභාගය සම්බන්ධයෙන් 2018.05.11 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද උක්ත නම් සඳහන් විභාග නිවේදනයේ දෙමළ විභාග නිවේදනයේ 8.0 ඡේදයේ (8.2) උපඡේදයේ (3) වගන්තිය හා 8.0 ඡේදයේ (8.3) උපඡේදයේ (3) වගන්තිය පහත පරිදි සංශෝධනය විය යුතු බව කාරුණිකව දන්වමි.

*8.0*

*8.2 பரீட்சைக்கான பாடங்களும் ஒவ்வொரு பாடத்திற்கும் ஒதுக்கப்பட்டுள்ள புள்ளிகளும் கீழே காண்பிக்கப்பட்டுள்ளன.*

| | நேரம் | புள்ளிககள் | சித்தியடைவதற்கான புளளிகள் |
|---|---|---|---|
| (3) பொது விவேகம் | 1 மணி. | 100 | 40 |

*8.3*

*(3) பொது விவேகம்:*

*புள்ளிவிபரவியல் ரீதியாக, மொழி ரீதியாக மற்றும் வடிவக் கட்டமைப்புக்கள் உறவுகளுக்கிடயிலான தொடர்புகள் போன்ற பிரச்சினைகள் மட்டிலான பகுப்பாய்வுத் திறமை, தர்க்க ரீதியான அறிவு, பொருள்கோடல் திறமை வேறு நிலைமைகளுக்கு உரித்தககிக் கொள்ளத்தக்கதான ஆற்றல் மற்றும் முடிவுகளை எட்டுதல் தொடர்பாக பரீட்சார்த்திக்குள்ள அறிவு மட்டத்தை அளவிடுதல், இதன் மூலம் எதிர்ப்பார்க்கடுகின்றது. பல்தேர்வு மற்றும் சுருக்கமான விடையளிக்கும் மாதிரியிலான வினாக்களைக் கொண்டிருப்பதுடன் அனைத்து வினாக்களுக்கும் விடை அளித்தல் வேண்டும்.*

*සටහන.-* මෙම සංශෝධන හේතුවෙන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය දීර්ඝ කරනු නොලැබේ.

කේ. වී. පී. එම්. ජේ. ගමගේ,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන කළමනාකරණ හා නීතිය හා
සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2018 සැප්තැම්බර් 07 වැනි දින,
රාජ්‍ය පරිපාලන කළමනාකරණ හා නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

09 -638

---

# I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

## බඩු බාහිරාදිය විකිණීම්

මගේ අංකය : ගම්/මහේ/අධි/ප්‍රා/වෙන්දේසි/2018

**මහෙස්ත්‍රාත් අධිකරණය - ගම්පහ**

අධිකරණ වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ
ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. ගම්පහ මහෙස්ත්‍රාත් අධිකරණය භාරයට පත්, රාජසන්තක කරනු ලැබූ, මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ 2018.10.13 වැනි දින පෙ.ව. 9.45 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් පාන්නන් වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර හෝ වෙන්දේසිය පැවැත්වෙන දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ නිසි අවසරය ලබාගෙන එදින පෙ.ව. 8.30 සිට 9.30 දක්වා වෙන්දේසියට නියමිත භාණ්ඩ පරීක්ෂා කල හැකි ය.

04. වෙන්දේසියේ දී මිලදී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා ඉල්ලුම්කරු විසින් වෙන්දේසි අවස්ථාවේදීම මුදල් ගෙවිය යුතු අතර, සියළුම ගෙවීම් මුදලින් ගෙවිය යුතුය. මේ සඳහ චෙක්පත් බාරගනු නොලබන අතර, මිලදී ගත් භාණ්ඩ එදිනම අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

05. වෙන්දේසි භාණ්ඩ ඉල්ලුම්කරුවන් හා ගැණුම්කරුවන් තම අනන්‍යතාව තහවුරු කර ගැනීම සඳහා ජාතික හැඳුනුම් පත හෝ වෙනත් පිළිගත හැකි හැඳුනුම් පතක් ඉදිරිපත් කල යුතු අතර, එසේ ඉදිරිපත් කිරීමට නොහැකි වන්නන්ට වෙන්දේසි භූමියට ඇතුල්වීමට අවසර දෙනු නොලැබේ.

06. අධිකරණය විසින් තබනු ලබන ලන්සුව නොපිළිගන්නා අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි වෙන්දේසිය සඳහා ඉදිරිපත් කල භාණ්ඩ ඉවත් කර ගැනීම හා අවලංගු කිරීම අධිකරණය සතු ය.

ඩී. ඒ. ආර්. පතිරණ,
මහෙස්ත්‍රාත්
මහෙස්ත්‍රාත් අධිකරණය,
ගම්පහ.

2018 අගෝස්තු මස 21 වැනි දින,
ගම්පහ මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

2018 - වෙන්දේසි ලැයිස්තුව

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* | *වටිනාකම රු.* |
|---|---|---|---|
| 01 | 42207/16/E | ගෑස් සිලින්ඩර 01 | |
| 02 | 42207/16/E | ගෑස් සිලින්ඩර 01 | |
| 03 | 42207/16/E | වට 03 යුත් යකඩ ගෑස් ලිප් 01 | |
| 04 | 64446/18/E | ගෑස් සිලින්ඩර 01 | |
| 05 | 64446/18/E | වට 04 යුත් යකඩ ගෑස් ලිප් 01 | |
| 06 | 60600/18/E | ගෑස් සිලින්ඩර 01 | |
| 07 | 60600/18/E | වට 04 යුත් යකඩ ගෑස් ලිප් 01 | |
| 08 | 64723/18/E | T.8.2 සඳහන් ගෑස් සිලින්ඩර 01 | |
| 09 | 64723/18/E | වට 02 යුත් ස්ටෑන්ඩ් එක සමග යකඩ ගෑස් ලිප් 01 | |
| 10 | 66336/18/E | ගෑස් සිලින්ඩර 01 | |
| 11 | 66336/18/E | වට 03 යුත් යකඩ ගෑස් ලිප් 01 | |
| 12 | 58887/17/E | ගෑස් සිලින්ඩර 01 | |
| 13 | 58887/17/E | ගෑස් සිලින්ඩර 01 | |
| 14 | 58887/17/E | ගෑස් සිලින්ඩර 01 | |
| 15 | 58887/17/E | ගෑස් සිලින්ඩර 01 | |
| 16 | 58887/17/E | ගෑස් සිලින්ඩර 01 | |
| 17 | 58887/17/E | වට 03 යකඩ ගෑස් ස්ටෑන්ඩ් එක සහිත ලිප් 01 | |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | වටිනාකම රු. |
|---|---|---|---|
| 18 | 58887/17/E | වට 03 යකඩ ගෑස් ලිප් 01 | |
| 19 | 58887/17/E | වට 03 යකඩ ගෑස් ලිප් 01 | ස්ටැන්ඩ් එක |
| 20 | 58887/17/E | වට 03 යකඩ ගෑස් ලිප් 01 | |
| 21 | 42739/16/E | ගෑස් සිලින්ඩර 01 | |
| 22 | 42739/16/E | ගෑස් සිලින්ඩර 01 | |
| 23 | 42739/16/E | නල 03 යුත් යකඩ ගෑස් ලිප් 01 | |
| 24 | 41452/16/E | ගෑස් සිලින්ඩර 01 | |
| 25 | 41452/16/E | වට 03 යුත් යකඩ ගෑස් ලිප් 01 | |
| 26 | 41087/16/E | ගෑස් සිලින්ඩර 01 | |
| 27 | 48236/17/E | ගෑස් සිලින්ඩර 01 | |
| 28 | 61875/18/E | ගෑස් සිලින්ඩර 01 | |
| 29 | 49129/17/E | ගෑස් සිලින්ඩර 01 | |
| 30 | 49129/17/E | වට 03 යකඩ ගෑස් ලිප් 01 | |
| 31 | 49129/17/E | වට 02 යකඩ ගෑස් ලිප් 01 | |
| 32 | 62153/18/E | ගෑස් සිලින්ඩර 01 | |
| 33 | 62153/18/E | වට 04 යුත් යකඩ ගෑස් ලිප් 01 | |
| 34 | 62153/18/E | අඩි 22 යුත් රබර් හෝස් බට 01 | |
| 35 | 59555/17/E | ගෑස් සිලින්ඩර 01 | |
| 36 | 59555/17/E | වට 04 යුත් යකඩ ගෑස් ලිප් 01 | |
| 37 | 42148/16/E | ගෑස් සිලින්ඩර 01 | |
| 38 | 42148/16/E | යකඩ ගෑස් ලිප් 01 | |
| 39 | 43562/16/E | ගෑස් සිලින්ඩර 01 | |
| 40 | 43562/16/E | වට 03 යුත් යකඩ ගෑස් ලිප් 01 | |
| 41 | 58507/17/E | ගෑස් සිලින්ඩර 01 | |
| 42 | 58507/17/E | ගෑස් සිලින්ඩර 01 | |
| 43 | 58507/17/E | වට 04 යුත් යකඩ ගෑස් ලිප් 01 | |
| 44 | 58507/17/E | වට 04 යුත් යකඩ ගෑස් ලිප් 01 | |
| 45 | 58507/17/E | ඇලුමිනියම් මුට්ටිය 01 | |
| 46 | 58507/17/E | අඩි 35 ක් දිග රබර් හෝස් 01 | |
| 47 | 55074/16/E | ගෑස් සිලින්ඩර 01 | |
| 48 | 55074/16/E | වට 03 යුත් යකඩ ගෑස් ලිප් 01 | |
| 49 | 64628/18/E | ගෑස් සිලින්ඩර 01 | |
| 50 | 64628/18/E | වට 03 ගෑස් ලිප් 01 | |
| 51 | 65161/18/E | ගෑස් සිලින්ඩර 01 | |
| 52 | 65161/18/E | වට 04 යුත් යකඩ ගෑස් ලිප් 01 | |
| 53 | 54076/17/E | ගෑස් සිලින්ඩර 01 | |
| 54 | 54076/17/E | වට 04 යුත් යකඩ ගෑස් ලිප් 01 | |
| 55 | 62742/18/E | වට 03 යුත් යකඩ ගෑස් ලිප් 01 | |
| 56 | 61664/18/E | වට 04 යුත් යකඩ ගෑස් ලිප් 01 | |
| 57 | 64897/18/E | වට 02 යුත් යකඩ ගෑස් ලිප් 01 | |
| 58 | 46454/16/E | වට 03 යුත් යකඩ ගෑස් ලිප් 01 | |
| 59 | 46454/16/E | වට 03 යුත් යකඩ ගෑස් ලිප් 01 | |
| 60 | 46454/16/E | වට 03 යුත් යකඩ ගෑස් ලිප් 01 | |
| 61 | 56915/17/E | වට 04 යුත් යකඩ ගෑස් ලිප් 01 | |
| 62 | 62404/18/E | වට 04 යුත් යකඩ ගෑස් ලිප් 01/සමග නිල් පාට රබර් බට 01 | |
| 63 | 62404/18/E | වට 04 යුත් යකඩ ගෑස් ලිප් 01 | |
| 64 | 62916/18/E | ඇලුමිනියම් කල 01 | |
| 65 | 61787/18/E | ඇලුමිනියම් කල 01 (පැස්සුම් සහිත) | |
| 66 | 61787/18/E | ඇලුමිනියම් භාජන 02 | |
| 67 | 65972/18/E | ඇලුමිනියම් කල 01 | |
| 68 | 13423/14/PC | ටෙනිස් බෝල 52 | |
| 69 | 34857/16/PC | කියත් (අත් කියත්) 01 | |
| 70 | 64747/18/S | සවල් 01 | |
| 71 | AR/57/18 | ප්ලාස්ටික් මල්පෝච්චි 02 | |
| 72 | 61980/18/S | වතුර මෝටර 01 | |
| 73 | 61980/18/S | වතුර මෝටර 01 | |
| 74 | 61980/18/S | අඟල් 02 වතුර බට 02 | |
| 75 | 61980/18/S | උදලු 01, යකඩ ඉනි 01, මිට රහිත මිටි 01, මිට සහිත පිකස් 01 | |
| 76 | 63156/18/S | උදලු 01, යකඩ ඉනි 01, කුළු ගෙඩි 01, මිටි 01, අඩි 1/2 දිග ගල්කටු 02, ගල් විදින කටු 01 | |
| 77 | 63156/18/S | වතුර මෝටර 01 (මෝටරයට සවිකරන ලද වයර් කෝඩ් 01 සමග) අඩි 50 දිග වතුර බටය | |
| 78 | 63156/18/S | අඩි 52 දිග ප්ලග් එක සමග වයර් කෝඩ් 01 | |
| 79 | 63156/18/S | රැවට්එක සමග අඩි 12 දිග නිල්පාට පටි 01 | |
| 80 | 63156/18/S | කඹ 01, නිල්පාට නයිලෝන් ලණු 01, අඩි 06 දිග සුදුපාට බට 01, අඩි 22 දිග නිල්පාට බට 01 | |
| 81 | 61562/18/S | අත් කියත් 01 | |
| 82 | 58365/17/S | මල්ටි සොකට් 01 | |
| 83 | 61698/18/S | මල්ටි සොකට් 01 | |
| 84 | 58359/17/S | ආහාර බහාලුම් 01 | |
| 85 | 61711/18/S | ජල කරාම 01 | |
| 86 | 58946/17/S | ජල කරාම 01 | |
| 87 | 58954/17/S | ජල කරාම 01 | |
| 88 | 66969/18/S | ජල කරාම 01 | |
| 89 | අංක රහිත | ගෑස් සිලින්ඩර 01 (ලිට්රෝ) 12.5 කි. ග්‍රෑ. | |
| 90 | අංක රහිත | ගෑස් සිලින්ඩර 01 (ලිට්රෝ) | |
| 91 | අංක රහිත | ගෑස් සිලින්ඩර 01 (ලිට්රෝ) | |
| 92 | අංක රහිත | ගෑස් සිලින්ඩර 01 (ලිට්රෝ) | |
| 93 | අංක රහිත | ගෑස් සිලින්ඩර 01 (ෂෙල් ) කි. ග්‍රෑ. 33.5 | |
| 94 | අංක රහිත | අබලි පා පැදිය | |
| 95 | අංක රහිත | අබලි පා පැදිය | |
| 96 | අංක රහිත | අබලි පා පැදිය | |
| 97 | අංක රහිත | අබලි පා පැදිය | |
| 98 | අංක රහිත | ක්‍රියා විරහිත (අබලි) සෝනි වීඩියෝ කැසට් රෙකෝඩරය | |
| 99 | අංක රහිත | ක්‍රියා විරහිත (අබලි) සෝනි හෙඩ්ක්ලීනර් | |
| 100 | අංක රහිත | ක්‍රියා විරහිත (අබලි) නැෂනල් වීඩියෝ කැසට් රෙකෝඩරය | |
| 101 | අංක රහිත | ක්‍රියා විරහිත (අබලි) JVC වීඩියෝ කැසට් රෙකෝඩරය | |
| 102 | අංක රහිත | ක්‍රියා විරහිත (අබලි) JVC හෙඩ් ක්ලීනර් 01 | |
| 103 | අංක රහිත | ක්‍රියා විරහිත (අබලි) සෝනි හෙඩ් ක්ලීනර් 01 | |
| 104 | අංක රහිත | ක්‍රියා විරහිත (අබලි) සෝනි කැසට් රෙකෝඩරය | |
| 105 | අංක රහිත | පලුදු ගෑස් ලිප් 01 | |
| 106 | අංක රහිත | පලුදු ගෑස් ලිප් 01 | |
| 107 | අංක රහිත | පලුදු ගෑස් ලිප් 01 | |
| 108 | අංක රහිත | ක්‍රියා විරහිත වතුර මෝටර කොටසක් | |
| 109 | අංක රහිත | ක්‍රියා විරහිත අයන් 01 | |
| 110 | අංක රහිත | නූල්පන්දු 03 | |
| 111 | අංක රහිත | අබලි ටේබල් පෑන් 01 | |
| 112 | අංක රහිත | වාහන ටයරය | |
| 113 | අංක රහිත | පිත්තල සරනේරු තොගය | |
| 114 | අංක රහිත | තරාදි පඩි සෙට් 01 | |
| 115 | අංක රහිත | විසිතුරු සෙරමික් භාණ්ඩ තොගය | |
| 116 | අංක රහිත | සවල් 07 | |
| 117 | අංක රහිත | යකඩ කපන විශාල කතුරු 02 | |
| 118 | අංක රහිත | වැය 01 අත්පොරෝ 01 සමග පොරෝ තොගයක් | |
| 119 | අංක රහිත | අබලි උදලු තල 16 | |
| 120 | අංක රහිත | අබලි ඔක්සිජන් ටැංකි 01 | |
| 121 | අංක රහිත | බට පතුරු වට්ටි 01 | |
| 122 | අංක රහිත | සෙරමික් භාණ්ඩ කට්ටල 01 | |
| 123 | අංක රහිත | ඇඹරුම් ගල් 01 | |
| 124 | අංක රහිත | පැදුරු මිටි 01 (පැරණි) | |
| 125 | අංක රහිත | දිරා පත් සිල්ක් රෙදි තොගයක් | |
| 126 | 34884/16/PC | අඳනකඩ 16 යි | |

09 - 220

---

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය- පොළොන්නරුව

### නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. පොළොන්නරුව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරන ලද, හිමිකම් නොකියන ලද, භාණ්ඩ හා නඩු අංක සොයාගත නොහැකි වූ කල්තබා ගැනීමේ දී විනාශ වී යා හැකි භාණ්ඩ 2018.09.30 වැනි දින පෙ. ව. 09.30 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසියේ පවත්වන දින වෙන්දේසියේ ආරම්භ කිරීමට ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳ සලකා බැලීම සඳහා අදාළ භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරනු ලැබේ.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට පෙර වෙන්දේසියේ නියමිත භාණ්ඩ මහජනතාවට පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන ලංසු මුදල නොපිළිගැනෙන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසි ඉවත් කර දැමීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ මිළදී ගනු ලබන භාණ්ඩ සඳහා මුදල් ගෙවීමේ දී ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් පමණක් ගෙවීම් සිදුකළ යුතු අතර, චෙක්පත්, බැංකු අණකර කිසිවක් භාර ගනු නොලැබේ.

06. භාණ්ඩ මිලදී ගැනීමේ දී තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

07. වෙන්දේසියෙන් මිළදී ගන්නා ලද භාණ්ඩ වෙන්දේසිය පවත්වන දිනයේ දී ප.ව. 05.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

08. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේ නම්, වෙන්දේසිය පවත්වන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

හර්ෂණ ධනුෂ්ක රත්නායක,
දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත්,
පොළොන්නරුව.

2018 අගෝස්තු මස 28 වැනි දින,
පොළොන්නරුව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 1. | 89748 | මඩචිල් කොටසක් |
| 2. | 82515 | උදලු 01 |
| 3. | 83749 | උදලු 01 |
| 4. | 87837 | ගැරුම් වට්ටි 01 |
| 5. | 83197 | මිට සහිත උදලු 01 |
| 6. | 81321 | මිට සහිත උදලු 01 |
| 7. | 80342 | උදලු 01 යි |
| 8. | 90361 | පොරව |
| 9. | 87568 | උදැල්ල 01 |
| 10. | 80077 | උදැල්ල 01 |
| 11. | 87843 | ගැරුම්වට්ටි 01 |
| 12. | 88778 | ගැරුම්වට්ටි 01 |
| 13. | 88780 | ගැරුම්වට්ටි 01 |
| 14. | 78602 | පා පැදි 01 |
| 15. | 4223 | කුළුගෙඩි 01 |
| 16. | 4459 | පොරව |
| 17. | 4223 | කුළුගෙඩි 01 |
| 18. | 8260 | පොරව |
| 19. | 8261 | පොරව |
| 20. | 8259 | පොරව |
| 21. | 4590 | උදැල්ල |
| 22. | 3905 | උදැල්ල |
| 23. | 83714 | උදැල්ල |
| 24. | 2533 | සවල් 01 |
| 25. | 92777 | පා පැදි 01 |
| 26. | 13881 | තරාදි 01 |
| 27. | 95642 | උදැල්ල |
| 28. | 17662 | පොරව |
| 29. | 95947 | උදැල්ල |
| 30. | 79695 | පා පැදි 01 |
| 31. | 1192 | පා පැදි 01 |
| 32. | 19707 | පා පැදි 01 |
| 33. | 2533 | සවල් 01 |
| 34. | 20017 | සවල් 01 |
| 35. | 29072 | සවල් 01 |
| 36. | 29071 | සවල් 01 |
| 37. | 21693 | සවල් 02 |
| 38. | 16793 | විදුලි පන්දම් 01 |
| 39. | 90126 | සවල් 01 |
| 40. | අංක රහිත | වේවැල් තොගය |
| 41. | 95583 | රිම් එක සහිත ටයර් 01 |
| 42. | 6006 | ගිනිගෙන විනාශ වී ඇති ත්‍රී විල් රථයක කොටස් |
| 43. | අංක රහිත | පස් අදින තාච්චි 01 |
| 44. | 6324 | සවල් 02 |
| 45. | 98261 | සවල් 01 |
| 46. | 96237 | බාල්දි 01 |
| 47. | 98930 | සවල් 01 |
| 48. | 90754 | සවල් 01 |
| 49. | 5075 | සවල් 01 |
| 50. | 1945 | ඉල්ලන් කූරු 01 |
| 51. | 98673 | සවල් 01 |
| 52. | 926 | විදුලි පන්දම් 01 |
| 53. | 8786 | ගැරුම් වට්ටි 01 |
| 54. | 87842 | ගැරුම් වට්ටි 01 |
| 55. | 92199 | ගැරුම් වට්ටි 01 |
| 56. | AR 749/14 | ත්‍රී විල් ටයර් 03 |
| 57. | AR 128/18 | යකඩ පට්ටම් 01, ජංගම දුරකථන 01 |
| 58. | අංක රහිත | බැරල් තොගය |
| 59. | අංක රහිත | විදුරු තොගය හා බුලි තොගය |
| 60. | 2447 | පා පැදි 01 |
| 61. | 87030 | පා පැදි 01 |
| 62. | 80770 | පා පැදි 01 |
| 63. | B 1336/13 | පා පැදි 01 |
| 64. | 94800 | ගිනිගෙන විනාශ වී ඇති යතුරු පැදියක කොටස් |
| 65. | 3626 | ජංගම ඉරුම් හල් 01 (කියත් තලය රහිත) |
| 66. | 15167 | ජංගම ඉරුම් හල් 01 (කියත් තලය රහිත) |
| 67. | 17017 | ජංගම ඉරුම් හල් 01 (කියත් තලය රහිත) |
| 68. | අංක රහිත | ජංගම ඉරුම් හල් 01 (කියත් තලය රහිත) |
| 69. | අංක රහිත | ජංගම ඉරුම් හල් 01 (කියත් තලය රහිත) |

09-306

---

## සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය - නොච්චියාගම

නොච්චියාගම සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද පහත උපලේඛනයේ විස්තර කර ඇති භාණ්ඩ 2018.10.06 වැනි දින පෙ.ව. 09.00ට නොච්චියාගම සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

කොන්දේසි :

01. මෙම වෙන්දේසිය සඳහා ඉදිරිපත් කර ඇති කිසියම් භාණ්ඩයක් පිළිබඳ අයිතිවාසිකම් කියන තැනැත්තෙකු සිටිනම් එම අයිතිවාසිකම් වෙන්දේසිය පවත්වනු ලබන දින පෙ.ව. 9.30ට පෙර ලිඛිතව මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

02. අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා ගෙන එදින පෙ.ව. 8.30 සිට 9.30 දක්වා වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකි ය.

ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 04 පළමු මහල, ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල, ඇහැළියගොඩ.

සමාගමේ ලේකම් : Dr. ජේ. එම්. ඩී. ආරියරත්න
(වරලත් ගණකාධිකාරී)

09 - 248

---

### දූන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : Prasad Engineering And Marine Service ( Private) Limited.
සංස්ථාගත කළ දිනය : 2018.07.17
ලියාපදිංචි අංකය : PV00202139
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 17, යෝධ ඇළ අසල, කලගෙදර, ඇඹිලිපිටිය.
සමාගමේ ලේකම් : Dr. ජේ. එම්. ඩී. ආරියරත්න
(වරලත් ගණකාධිකාරි)

09 - 249

---

### මහජනතාව වෙත දූනුම්දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත පුද්ගලික සමාගම 2018 අගෝස්තු මස 01 වැනි දින ස්ථාපිත කළ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : රකපුම (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 00202617
ලියාපදිංචි කාර්යාලය : 3 වැනි මහල අංක 11, කාසල් පටුමග, කොළඹ 04.

එකවුන්ටින් සිස්ටම්ස් සෙක්‍රටේරියල් සර්විසස්
(ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්.

03 වන මහල, අංක 11,
කාසල් පටුමග, කොළඹ 04.

09 - 263

---

### සී එෆ් ඩී මාකර්ටිං (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගමේ ලියාපදිංචි අංකය PV 87024

2007 අංක 07 දරන සමාගම් පනතේ 346 (1) වගන්තිය යටතේ ඈවරකරුවන්ගේ පත්වීමේ දූන්වීම

සමාගමේ නම : සී එෆ් ඩී මාකර්ටිං (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 38, සිරිමල් උයන, මත්තේගොඩ, පොල්ගස්ඕවිට.
උසාවිය : බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය (කොළඹ සිවිල්)
නඩු අංකය : HC (CIVIL) 27/18/CO
ඈවරකරුවන්ගේ නම් : පිංචබදුගේ එක්සිරි අරුණ ජයවික්‍රම සහ ජෙරාඩ් ජීවානන්තන් ඩේවිඩ්(ඈවරකරුවන්)
ලිපිනය : 3 වන මහල, අංක 11, කාසල් පටුමග, කොළඹ 04.
පත්වීමේ දිනය : 2018 ජුනි 14

09 - 264/1

---

### සී එෆ් ඩී මාකර්ටිං (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගමේ ලියාපදිංචි අංකය PV 87024

2007 අංක 07 දරන සමාගම් පනතේ XII යටතේ පරිවෘත කිරීමේ නියෝගය

සමාගමේ නම : සී එෆ් ඩී මාකර්ටිං (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 38, සිරිමල් උයන, මත්තේගොඩ, පොල්ගස්ඕවිට.
උසාවිය : බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය (කොළඹ සිවිල්)
නඩු අංකය : HC (CIVIL) 27/18/CO
නියෝගය දුන් දිනය : 2018 ජුනි 14
පෙත්සම ඉදිරිපත් කළ දිනය : 2018 අප්‍රේල් 03
ඈවරකරුවන්ගේ නම් : පිංචබදුගේ එක්සිරි අරුණ ජයවික්‍රම සහ ජෙරාඩ් ජීවානන්තන් ඩේවිඩ් ඈවරකරුවන්,
ලිපිනය : 3 වන මහල, අංක 11, කාසල් පටුමග, කොළඹ 04.

09 - 264/2

---

### පීසී හවුස් පීඑල්සී

සමාගමේ ලියාපදිංචි අංකය PV 1827 PB-PQ

2007 අංක 07 දරන සමාගම් පනතේ 346 (1) වගන්තිය යටතේ ඈවරකරුවන්ගේ පත්වීමේ දූන්වීම

සමාගමේ නම : පීසී හවුස් පීඑල්සී
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 451, ගාලු පාර, කොළඹ 03.
උසාවිය : බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය (කොළඹ සිවිල්)
නඩු අංකය : HC (CIVIL) 47/2013/CO
ඈවරකරුවන්ගේ නම් : පිංචබදුගේ එක්සිරි අරුණ ජයවික්‍රම සහ ජෙරාඩ් ජීවානන්තන් ඩේවිඩ් ඈවරකරුවන්,
ලිපිනය : 3 වන මහල, අංක 11, කාසල් පටුමග, කොළඹ 04.
පත්වීමේ දිනය : 2018 මාර්තු 19

09 - 265/1

---

### පීසී හවුස් පීඑල්සී

සමාගමේ ලියාපදිංචි අංකය PV 1827 PB-PQ

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ පරිවෘත කිරීමේ නියෝගය

සමාගමේ නම : පීසී හවුස් පීඑල්සී
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 451, ගාලු පාර, කොළඹ 03.
උසාවිය : බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය (කොළඹ සිවිල්)
නඩු අංකය : HC (CIVIL) 47/2013/CO
නියෝගය දුන් දිනය : 2018 මාර්තු 19
පෙත්සම ඉදිරිපත් කල දිනය : 2013 ඔක්තෝබර් 21
ඈවරකරුවන්ගේ නම් : පිංචබදුගේ එක්සිරි අරුණ ජයවික්‍රම සහ ජෙරාඩ් ජීවානන්තන් ඩේවිඩ්, (ඈවරකරුවන්),
ලිපිනය : ඈවරකරුවන්, 3 වන මහල, අංක 11, කාසල් පටුමග, කොළඹ 04.

09 - 265/2

---

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කඩුවෙල, හේවාගම, විහාර මාවත, අංක 115/4 හි පදිංචි යහම්පත් ආරච්චිගේ දොන් ඉන්ද්‍රානි බර්නඩෙට් සමරතුංග (ජා.හැ.අ. 576671393 V) වන මා විසින් රණාල, ජල්තර, කුරුඳුවත්ත පාර, අංක 314/2ඩී හි පදිංචි වතුතංත්‍රිගේ යෂිකා රුවිනි පීරිස් (ජා.හැ.අ. 897220261 V) යන අය වෙත ප්‍රදානය කරන ලද ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඔගස්ටස් එස්. ජයරත්න මහතා විසින් ලියා සහතික කරන ලද අංක 3023 හා 2018.04.27 වැනි දින දරන විශේෂ ඇටර්නි බලපත්‍රය වහාම බලපැවැත්වෙන පරිදි මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරන ලද බවත්, එකී වතුතංත්‍රිගේ යෂිකා රුවිනි පීරිස් යන අය විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මින් ඉදිරියට මා වග නොකියන බවත්, ඒ හා සම්බන්ධ කිසිදු වගකීමකට නොබැඳෙන බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දූනුම් දෙමි.

Yahampath Arachchige Don Indrani
Bernadette Samaratunga.

09-269

# රටබීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

**උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද නැවත විකිණීම - 2019 වර්ෂය

2019 වර්ෂයට අදාළව 2018.08.20 වැනි දින පෙ. ව. 10.30 ට උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පවත්වන ලද විදේශ මත්පැන් තැබෑරුම් රේන්දය විකිණීමේ කටයුත්තේ දී ටෙන්ඩර් මණ්ඩලය සෑහීමකට පත්වන ආකාරයෙන් ටෙන්ඩර් මිල ගණන් ඉදිරිපත් නොවීම හේතුවෙන් ඉහත විදේශ මත්පැන් තැබෑරුම් රේන්දය නැවත විකිණීමට සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් තීරණය කර ඇති අතර, ඊට අදළ නිවේදනය හා කොන්දේසි පහත දක්වා ඇත.

02. 1982 වර්ෂයේ අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ 1983 වර්ෂය හා ඊට පසු කාල පරිච්ඡේදය සඳහා විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී වලංගුව පවත්නා සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහිම බලපාන පොදු සුරාබදු කොන්දේසිවලටත් යටත්ව, 2019 වර්ෂය තුළ විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයක් මිලදී ගැනීම සඳහා උඩපළාත ප්‍රාදේශීය ලේකම් තැන වන, මා විසින් 2018.09.27 වැනි දින පෙ. ව. 10.30 තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

03. සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නිසි ආකෘති පත්‍රයකින් සමන්විත විය යුතු අතර,

(අ) ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇති අන්දමට නිසි ටෙන්ඩර් මුදලක් තැන්පත් කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක්, සහ

(ආ) ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් තැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ නිශ්චල දේපළ පිළිබඳව වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථෝක්ත රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කෙරේ. ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවය සම්බන්ධයෙන් විශේෂයෙන් සැලකිලිමත් විය යුතු යః-

(i) ටෙන්ඩර් පත්‍ර මුළුමනින් ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය;

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍ර පෝරමවල නියමිත සාක්ෂිකරුවන් අත්සන් යොදා තිබිය යුතු ය;

(iii) සෑම වෙනස් කිරීමක් හෝ කපා හැරීමක්ම ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන සහ දිනය යොදා සහතික කර තිබිය යුතු ය.

මෙහි නියමයන්ට පටහැනිව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. විධිමත්ව සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍ර -

(අ) ටෙන්ඩර් තැන්පත් මුදල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක තැන්පත් කර ලබා ගන්නා ලද කුවිතාන්සියක්; හා

(ආ) වත්කම් සහතිකයක් සමග

ලියුම් කවරයක බහා මුද්‍රා තබා ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරේ තැබෑරුම් අංකය සහ නම සඳහන් කර උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන් වීමට ප්‍රථම තැන්පත් කළ යුතුය. එසේ *නැතහොත්* ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත් වීමට ප්‍රථමයෙන් උඩපළාත ප්‍රාදේශීය ලේකම් තැනට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

05. එක් එක් රේන්දයක් වෙනුවෙන් ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන වේලාව පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇත. එකී වේලාවන්හි දී සියලුම ටෙන්ඩර්කරුවන් උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. සාර්ථක ටෙන්ඩරයක් ඉදිරිපත් කර "වරප්‍රසාදය මිල දී ගත් තැනැත්තා"යැයි ප්‍රකාශ කරනු ලැබූ පසු එම දින ප. ව. 2.30ට පෙර උඩපළාත ප්‍රාදේශීය ලේකම් තැන විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප වශයෙන් උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කොට යට කී විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතු ය. මෙම ගෙවීම් මුදලින් හෝ බැංකුව විසින් ''ගෙවීම් සඳහා'' ලකුණු කළ චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් හෝ ආරක්ෂිත චෙක්පත් නැමැති ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ විය යුතු ය.

07. වැඩි විස්තර උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා දැනගත හැකි ය.

ආර්. ඒ. ඩී. ටී. එන්. තෙන්නකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
උඩපළාත- ගම්පොල.

2018 අගෝස්තු මස 28 වැනි දින,
ගම්පොල- උඩපළාත
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

2019 වර්ෂය සඳහා ගම්පොල උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනුමත කරන ලද විදේශ මත්පැන් තැබෑරුම් ලැයිස්තුව

| *අංකය හා නම* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු කොට්ඨාසය* | *තැබෑරුම් විවෘත කර තබන වේලාව* | *ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන දිනය සහ වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ.* |
|---|---|---|---|---|---|
| 01. පුස්සැල්ලාව විදේශ මත්පැන් තැබෑරුම | උඩපළාත | පුස්සැල්ලාව නගර සීමාව තුළ | පෙ. ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා සහ ප.ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා | 2018.09.27 වැනි දින පෙ. ව. 10.30 | 3,000.00 |

09-339

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්. සී. - දික්වැල්ල ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මාතර ප්‍රසිද්ධ නොතාරිස් ටී. එන්. පිණිදිය විසින් සහතික කරන ලද්දවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දවූ ද, 2012 ඔක්තෝබර් මස 03 වැනි දින සහතික කළ අංක 2329 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම ලොකු කමදි හෙන්නැදිගේ රවීන්ද්‍ර තිලක් කුමාර සහ පාස් හෙන්නැදිගේ තරංගා කුමාරි ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අය විය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අය කර ගැනීම පිණිස පහත සඳහන් දේපළ වර්ෂ 2018 ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දින පෙ. ව. 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළ.- දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ මාතර කඩවත් සතරේ මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වේරදූව 425 ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වේරදූව හි පිහිටි දෙනගමගේ වත්ත හෙවත් තලගහවත්ත යන ඉඩමෙන් බෙද වෙන් කළ ලොට් ඒ දෙනගමගේ වත්ත හෙවත් තලගහ වත්ත යන ඉඩමෙන් බෙදා වෙන් කළ ලොට් බී වලින් බෙද වෙන් කළ ලොට් 5 සහ දෙනගමගේ වත්ත හෙවත් තලගහවත්ත යන ඉඩමෙන් බෙද වෙන් කළ ලොට් බී නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. එච්. බී. නිහාල් සිල්වා විසින් 2005 අගෝස්තු මස 12 වැනි දින පිළියෙල කරන ලද අංක 2549 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් එක්ස් වශයෙන් දක්වෙන රූඩ් එකයි පර්චස් හයයි දශම තුනයි අට (අ. 0, රූ. 1 පර්. 6.38) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග පස වගාවන් සහ ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2018.07.06 වැනි දින දරන රජයේ ගැසට් පත්‍රය හා 2018.07.12 දිනැති ලක්බිම, ඩේලි මිරර් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

දේපළට පිවිසීම.- මාතර නගරයේ සිට තංගල්ල පාරේ කිලෝ මීටර් 02ක් පමණ ගොස් මැද්දවත්ත හන්දියට පැමිණ වම් අත දෙසට අති කැකනදුර පාරේ මීටර් 300ක් පමණ යන විට පාරේ වම් අත පැත්තේ අදාල දේපළ පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය. - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%)ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහස (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සියය (රු. 500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනුවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට හා දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදළ ලේඛන පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක 011- 2661828, 2661866.

ජේ. ඩබ්ලිව්. ඊ. ජයවර්ධන,
(මුළු දිවයිනට ම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්,
තක්සේරුකරු හා බලයලත් වෙන්දේසිකරු.
අංක 59, කුමාර මාවත, පටුවත, දෙඩන්දූව,
දුරකතන අංක 091 - 2277105, 0779 - 663420
ඊමේල් : ejayawardhana77@gmail.com

09-289

**ප්‍රාදේශීය සංවර්ධන බැංකුව**

2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 40 වන සංශෝධනය මගින් සහ 1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 4 වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, උතුරු පිටිගල් කෝරළේ, මුන්නේෂ්වරම් පත්තුවේ, හලාවත ප්‍රාදේශීය සභා සීමාවට සහ මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කරුක්කුවටවන ග්‍රාම නිළධාරි වසමේ, කරුක්කුවටවන ග්‍රාමයේ පිහිටි බලයලත් මිනින්දෝරු එම්. පී. ෂෙල්ටන් සමරතුංග විසින් සාදන ලද 1989.05.24 දිනැති අංක 3256 දරන පිඹුරේ ලොට් අංක 01 ලෙස දැක්වෙන කුඹුක්වැව එස්ටේට් ලෙස හැඳින්වෙන ඉඩමෙන් සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය අක්.13, රූඩ්.00, පර්.25

එහි පිහිටි ගොඩනැගිල්ල සහ සියල්ල සහිතව ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2018 ඔක්තෝබර් මස 02 වැනි අඟහරුවාදා දින ප.ව. 3.00ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

තීරණය පිළිබඳ දැන්වීම.-කරුණාකර 2018 ජනවාරි මස 19 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2018 මාර්තු මස 29 වැනි දිනැති දිනමිණ, ඩේලි නිවුස් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

දේපළ වෙත පිවිසීම.- මාදම්පේ නව නගරයේ සිට මැදගම පාරේ සෙම්බුකට්ටිය පාසල දක්වා ගමන් කරන්න. එතැනින් දකුණට හැරී ගමන් කරන විට අදාළ දේපළ කොකෝ සමාගම සහ මැටල් ක්‍රෂරය අසල පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය.- මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය. :-

1. ගැණුම් මිලෙන් 25% (සියයට විසිපහක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්) සහ එම කොමිස් මුදලට අදළ සියලුම බදු,
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500,
5. අලෙවිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් පවතී නම් එම ගෙවීම්,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු,

ගැණුම් මිලෙන් 75% (සියයට හැත්තෑපහක්) වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත කළමණාකරු, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, කොළඹ පාර, මහවැව වෙත ගෙවිය යුතු වේ. දුරකථන 032 2254812.

ඉහත සඳහන් කළ පරිදි දින 30ක් ඇතුළත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවනු ලැබ ඇති විකුණුම් මිලෙන් 25% ක මුදලක් බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතු වේ.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් අදාළ විස්තර ඉහත කී ලිපිනයෙන් ලබාගත හැක.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුය"

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 126 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

ප්‍රධාන කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

නගර කාර්යාලය :
6 ඒ, ෆෙයාර්ෆීල්ඩ් ගාර්ඩන්,
කොළඹ 08
දුරකථන අංක : 011-2671467, 011- 2671468
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2671469
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

09-291

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී.එල්.සී. - බලංගොඩ ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**පළවන උපලේඛනය**

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, මැද කෝරළේ හෙළ උඩ පත්තුවේ බලංගොඩ නගර සභාවේ බලංගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ බලංගොඩ ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ, වතුකරගොඩ හි පිහිටි වෙරළුකැටිය මුකලාන නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු A. රත්නම් විසින් 1991 අගෝස්තු 17 දින මැන සාදන ලද අංක 2737 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් D දරන.

ප්‍රමාණය පර්චස් විස්සක් (අ.0, රූ.0, පර්.20)
විශාලත්වයෙන් යුත් ඉඩම සමග එහි පිහිටි සියලු දේත් සමග වේ.

**දෙවන උපලේඛනය**

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, මැද කෝරළේ හෙළ උඩ පත්තුවේ බලංගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ බලංගොඩ ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ, වතුකරගොඩ හි පිහිටි තැනවත්තහේන හෙවත් තැන්නවත්තහේන සහ එගොඩවත්තහේන හෙවත් ගොඩවත්තහේන නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු E. T. P. පෙරේරා විසින් 2008 ජුනි 30 දින මැන සාදන ලද අංක 3090 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 01 දරන ප්‍රමාණය පර්චස් විස්සයි දශම දෙකයි බිංදුවක් (අ.0, රූ.0, පර්.20.20) හෙවත් (හෙක්ටයාර් 0.05114) විශාල යුත් ඉඩම සමග එහි පිහිටි සියලු දේත් සමග වේ.

උඩවත්ත රංජිත් උඩවත්ත ණයකරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කරන ලද ඉහත 1 සහ 2 උපලේඛනවල සඳහන් දේපළ.

1 වන උපලේඛනයේ සඳහන් දේපළ (අ.0, රූ.0, පර්.20) වර්ෂ 2018 ක්වූ ඔක්තෝබර් මස 12 වැනි දින ප.ව. 12.30 ට

2 වන උපලේඛනයේ සඳහන් දේපළ (අ.0, රූ.0, පර්.20.20) වර්ෂ 2018 ක්වූ ඔක්තෝබර් මස 12 වැනි දින ප.ව. 1.30 ට

ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2018.06.22 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද , 2018.06.25 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් හා තිනකුරල් පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2018.09.14 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2018.09.17 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ තිනකුරල් පුවත්පත් ද බලන්න.

ඉඩම්වලට පිවිසීම්-

**1 වන උපලේඛනය** :- බලංගොඩ නගර මධ්‍යයේ සිට මීටර් 200ක් පමණ ගමන්කළ විට හමුවන බාන්ස් රත්වත්ත මාවත ඔස්සේ වම්පසින් පිහිටි උඩකන්ද පාරට පැමිණ එම පාරේ මීටර් 100ක් පමණ ගමන්කළ විට අදාළ දේපළ වම් අත පැත්තේ පිහිටා ඇත.

**2 වන උපලේඛනය** :- බලංගොඩ නගර මධ්‍යයේ සිට මීටර් 200ක් පමණ ගමන් කළ විට හමුවන බාන්ස් රත්වත්ත මාවත ඔස්සේ පෙට්ටිගල පාරට පැමිණ එම පාරේ මීටර් 150ක් පමණ ගමන්කර වමට හැරුණු විට කොටුගොඩැල්ල පාර හමු වේ. එම පාරේ මීටර් 300ක් පමණ ගමන්කළ විට අදාළ දේපළට පිවිසුම් මාර්ගය දකුණු අත පැත්තේ පිහිටා ඇත. එම පාරේ මීටර් 30ක් පමණ ගමන් කළවිට අදාළ දේපළ එම පාරේ වම් පැත්තේ පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය : විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු යි.

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
2. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
4. නොතාරිස් ගාස්තුව රු.2,000.00,
5. ලිපිකරුගේ හා සෝෂක වේතන රු.500.00,
6. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම්,
7. ගැණුම්කරු විසින් එකතුකළ වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි.

ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුළදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි ප්‍රධාන කාර්යාලයේ හෝ බලංගොඩ ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න කළමණාකරු, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී, අංක 195, රත්නපුර පාර, බලංගොඩ.

දුරකථන : 045- 2286719/045-2286697
ෆැක්ස් : 045-2286700

එල්. බී. සේනානායක
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල, උසාවි පාර, කොළඹ 12
දුරකථන : 011-2445393/ 011-2396520
ෆැක්ස් : 011-2445393
ඊමේල් :senaservice84@gmail.com

09-370

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී.එල්.සී. - බම්බලපිටිය ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාදින්නාගොඩ, 513B ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අළුත්කුරු කෝරළේ දකුණ අඹතලෙන්පහළ කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොතටුව හි පිහිටි මිල්ලගහවත්ත, දෙල්ගහවත්ත හෙවත් මිල්ලග හවත්ත, පෙළෙන්ගහවත්ත සහ කොස්ගහලියද්ද නැමති ඉඩමට (බලයලත් මිනින්දෝරු K. M. A. H. බණ්ඩාර විසින් 2005 ජූලි 30 වැනි දින මැන සාදන ලද අංක 2024A දරන පිඹුරේ ලොට් 1 සහ 2 අනු බෙදීමකින් ඒකාබද්ධ වේ.) බලයලත් මිනින්දෝරු K. M. A. H. බණ්ඩාර විසින් 2005 සැප්තැම්බර් 12 වැනි දින මැන සාදන ලද අංක 2066A දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 30 දරන ප්‍රමාණ පර්චස් එකොළහයි දශම දෙකයි බිංදුවක් (අ.0, රූ.0, පර්.11.20) හෙවත් හෙක්ටයාර් 0.0283 විශාලත්වයෙන් වූ ඉඩම සමග පදිංචි නිවස, ගහකොළ, වගාවන් සහ ඒ තුළ පිහිටි සියළුදේත් සමග වේ.

පහත දැක්වෙන පාරක් සඳහා වෙන්කරන ලද බිම් කොටස් මතින් ගමන් කිරීමේ ප්‍රවේශ අයිතිය ද සමග වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාදින්නාගොඩ, 513B ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අළුත්කුරු කෝරළේ දකුණ අඹතලෙන්පහළ කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොතටුව හි පිහිටි මිල්ලගහවත්ත, දෙල්ගහවත්ත හෙවත් මිල්ලග හවත්ත, පෙළෙන්ගහවත්ත සහ කොස්ගහලියද්ද නැමති ඉඩමට (බලයලත් මිනින්දෝරු K. M. A. H. බණ්ඩාර විසින් 2005 සැප්තැම්බර් 12 වැනි දින මැන සාදන ලද අංක 2066A දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද

1. ලොට් 13 ප්‍රමාණය (අ.0, රූ.1, පර්.25.25) හෙවත් හෙක්ටයාර් 0.1650 (අඩි 30ක් පළල වෙන්කරන ලද පාර)
2. ලොට් 26 ප්‍රමාණය (අ.0, රූ.0, පර් 6.30) හෙවත් හෙක්ටයාර් 0.0159 (අඩි 20ක් පළල වෙන්කරන ලද පාර)
3. ලොට් 33 (අ.0, රූ.0, පර්.37.70) හෙවත් හෙක්ටයාර් 0.0954 (අඩි 23ක් පළල වෙන්කරන ලද පාර)
4. ලොට් 34 (අ.0, රූ.0, පර්.18.80) හෙවත් හෙක්ටයාර් 0.0476 (අඩි 20ක් පළල වෙන්කරන ලද පාර)

එගොඩවත්ත හෙට්ටිආරච්චිගේ රනිල් සුමුදු ෆ්‍රැන්සිස්කෝ ණයකරු වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හට උකස් කරන ලද ඉහත උපලේඛනයේ සඳහන් දේපළ,

වර්ෂ 2018 ක්වූ ඔක්තෝබර් මස 10 වැනි දින පෙ.ව. 11.00 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2018.06.22 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2018.06.25 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ තීනකුරල් පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2018.09.14 වැනි දින රජයේ ගැසට් පත්‍රය, 2018.09.18 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ තිනකුරල් පුවත්පත් ද බලන්න.

ඉඩම්වලට පිවිසීම්-

බොරැල්ල හංදියේ සිට රාජගිරිය පාරේ මීටර් 600ක් පමණ ගමන් කළවිට දකුණු පසින් මාදින්නාගොඩ පාර පිහිටා ඇත. එම පාරේ කි.මී. 1ක් පමණ ගමන් කළවිට ආරච්චිහේන පාර හමුවේ. එම පාරේ මීටර් 150ක් පමණ ගමන් කළවිට නන්දන මාවත හමු වේ. එම පාරේ මීටර් 150ක් ගමන් කළවිට දකුණු පසින් අදාළ දේපළ පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය : විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු යි.

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
2. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
4. නොතාරිස් ගාස්තුව රු.2,000.00,
5. ලිපිකරුගේ හා සෝෂක වේතන රු.500.00,
6. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම්,
7. ගැණුම්කරු විසින් එකතුකළ වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි.

ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුළදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි ප්‍රධාන කාර්යාලයේ හෝ බම්බලපිටිය ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න කළමණාකරු, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී, අංක 232, ගාලු පාර, කොළඹ 04.

දුරකථන අංක : 011-2594439/011-2507724
ෆැක්ස් : 011-2591440

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ
වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල, උසාවි පාර, කොළඹ 12
දුරකථන : 011-2445393/ 011-2396520
ෆැක්ස් : 011-2445393
ඊමේල් : senaservice@sltnet.lk/senaservice84@gmail.com

09-371

---

**සෙලාන් බැංකුව පීඑල්සී - මහනුවර ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ මහනුවර පදිංචි හෙට්ටිආරච්චිගේ විජේසිංහ යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් ජානකී කරලියද්ද නවරත්න විසින් ලියා සහතික කරන ලද 2013.12.12 දිනැති අංක 1426 සහ 2014.11.03 දිනැති අංක 1576 සහ 2015.12.30 දිනැති අංක 1756 සහ 2017.02.22 දිනැති අංක 1951 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු ගෙවීම් කිරීම පැහැර හැර ඇති හෙයින් මෙම දේපළ සෙලාන් බැංකුව වෙත සුරක්ෂිත කර ඇත.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩගම්පහ කෝරළේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ අමුණුගම ප්‍රාදේශීය සභා සීමාව සහ ග්‍රාමසේවක කොට්ඨාසය තුළ අමුණුගම පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ආර්. එම්. එම්. රත්නායක විසින් සාදන ලද 2013.11.03 දිනැති අංක 2758 දරන සැලැස්මේ නිරූපණය වන "පෙතිගේගලගාව වත්ත හෙවත් පෙතිගලවත්ත" නමැති ඉඩමේ ලොට් 03 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස රූඩ් දෙකයි පර්චස් විස්සක් (අ.0, රූ.02, පර්.20) විශාල ගොඩනැගිල්ල, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් දේපළ 2018 ඔක්තෝබර් මස 03 වැනි දින පෙරවරු 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම - මහනුවර නගරයේ සිට දිගන පාර ඔස්සේ ගොස් නටාරම්පොත දක්වා පැමිණ වම්පසට ඇති මැණික්හින්න පාරට හැරෙන්න. (මාර්ග අංක 621) එම මාර්ගය ඔස්සේ තවත් කි. මී. 3ක පමණ දුරක් ගොස් යක්ග හපිටිය දක්වා පැමිණ වම්පසට ඇති ලේවැල්ල පාරට හැරී තවත් මීටර් 500ක පමණ දුරක් ගිය විට අදාළ දේපළ මාර්ගයේ වම්පසින් මාර්ගයට මුහුණලා පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම - රජයේ ගැසට් පත්‍රයේ 2018.07.20 වැනි දින පළවී ඇති අතර, ඩේලිමිරර් පුවත්පතේ 2018.07.18 වැනි දින ලංකාදීප පුවත්පතේ 2018.07.19 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2018.07.18 වැනි දින පළවී ඇත.

ගෙවීමේ ක්‍රමය.- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය. :-

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්),
4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000.00,
5. ලිපිකරුගේ හා සෝෂක වේතන රු. 1,000.00
6. සියලුම ප්‍රචාරක වියදම්.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක්වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු යි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10%ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.
හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : නීති ප්‍රධානී, සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකතන අංක : 011 2456477, 2456481.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

තුසිත් කරුණාරත්න (සාම විනිසුරු).
බලයලත් වෙන්දේසිකරු
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්
50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකතන අංක : 011-3068185, 011-2572940.

09-372

---

**සෙලාන් බැංකුව පීඑල්සී - ගාල්ල ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ ගාල්ල ව්‍යාපාර ලියාපදිංචි අංක ජී/9580 යටතේ අත්සරා එන්ටර්ප්‍රයිසස් ඇන්ඩ් මෝටර් ට්‍රේඩිං යන නාමය, විලාශය සහ අභිධානය යටතේ හවුල් ව්‍යාපාරයන් පවත්වාගෙන යන ගාල්ල පදිංචි මොරගොඩගේ දොන් අසේල දිනේෂ් පින්තු සහ අරුණි නිරංගා අබේසිංහ යන අය බන්ධනදායි වශයෙල් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ ගාල්ල මහ නගර සභා සීමාව තුළ දංගෙදර - බටහිර 98ඩී ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ දංගෙදර පිහිටි බලයලත් මිනින්දෝරු පර්සි විජයසිංහ විසින් සාදන ලද 2010.01.30 දිනැති අංක 11/2010 දරන සැලැස්මේ නිරූපණය වල්පොලගේවත්ත හෙවත් හත්තොටුවගේවත්ත නැමති ඉඩමේ එකතු කළ සහ යාව පිහිටි ලොට් ඒ සහ බී වල සහ බලයලත් මිනින්දෝරු පර්සි විජයසිංහ විසින් සාදන ලද 2015.01.08 දිනැති අංක 04/2015 දරන සැලැස්මේ නිරූපණය වන වල්පොලගේවත්ත සහ හත්තොටුවගේවත්ත නමැති එකතු කළ කළ ඉඩමේ ලොට්ස් ඒ සහ බී වල ලොට් 4හි ලොට් 4බී වල වෙන්කළ ලොට් 5 නමැති යාව පිහිටි සහ එකතු කළ ඉඩම් කැබලි දෙකෙහි නැවත මැනීමක් වන බලයලත් මිනින්දෝරු පර්සි ජයසිංහ විසින් සාදන ලද 2015.01.18 දිනැති අංක 09/2015 සැලැස්මේ නිරූපණය වන ලොට් ඒ නමැති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස පර්චස් දහතුනක් (අ.0, රූ.0, පර්.13.0) නොහොත් හෙක්ටයාර 0.03288ක් විශාල බිම, ගස්, වගා, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

අංක 11/2010 සැලැස්මේ නිරූපණය වන ලොට් 8 ලකුණු කළ ඉඩම උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමග.
ඉහත සඳහන් දේපළ 2018 ඔක්තෝබර් මස 05 වැනි දින පෙරවරු 10.30 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම - දංගෙදර මංසන්ධියේ සිට ස්ටීල් පාර ඔස්සේ මීටර් 100ක් පමණ ඉදිරියට ගොස් දකුණුපසට ඇති මල්වත්ත පන්සල පාරට හැරී තවත් මීටර් 100ක් පමණ ගිය විට වම්පසින් ඇති මාර්ගයට හැරෙන්න. එම මාර්ගය දිගේ තවත් මද දුරක් ගිය විට අදාළ දේපළ මාර්ගයේ දකුණුපසින් පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම - රජයේ ගැසට් පත්‍රයේ 2018.05.25 වැනි දින පළවී ඇති අතර, ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2018.05.21 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2018.05.25 වැනි දින පළවී ඇත.

ගෙවීමේ ක්‍රමය.- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය. :-

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්),
4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000.00,
5. ලිපිකරුගේ හා සෝෂක වේතන රු. 1,000.00,
6. සියලුම ප්‍රචාරක වියදම්.

7. ගැණුම් මිලෙන් ඉතිරි 90% ක්වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු යි.
ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10%ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : නීති, කළමනාකාරිණිය, සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාළු පාර, කොළඹ 03. දුරකතන අංක : 011 2456478, 2456481.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

තුසිත් කරුණාරත්න (සාම විනිසුරු).
බලයලත් වෙන්දේසිකරු
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්
50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකතන අංක : 011-3068185, 011-2572940.

09-373

---

**සෙලාන් බැංකුව පීඑල්සී - ගාල්ල ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපළ ගාල්ල පදිංචි මොරගොඩගේ දොන් අසේල දිනේෂ් පින්තු සහ අරුණි නිරංගා අබේසිංහ යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

1 වන වෙන්දේසිය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ ගාල්ල මහ නගර සභා සීමාව තුළ දංගෙදර - බටහිර 98ඩී ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ දංගෙදර පිහිටි බලයලත් මිනින්දෝරු පර්සි විජයසිංහ විසින් සාදන ලද 2010.01.30 දිනැති අංක 11/2010 දරන සැලැස්මේ නිරූපණය වන වල්පොලගේවත්ත හෙවත් හත්තොටුවගේවත්ත නමැති ඉඩමේ එකතු කළ සහ යාව පිහිටි ලොට් ඒ සහ බී වල සහ බලයලත් මිනින්දෝරු පර්සි විජයසිංහ විසින් සාදන ලද 2015.01.08 දිනැති අංක 04/2015 සැලැස්මේ නිරූපණය වන වල්පොලගේවත්ත සහ හත්තොටුවගේවත්ත නමැති එකතු කළ ඉඩමේ ලොට්ස් ඒ සහ බී වල ලොට් 4හි ලොට් 4බී වල වෙන්කල ලොට් 5 නමැති යාව පිහිටි සහ එකතු කළ ඉඩම් කැබලි දෙකෙහි මැනීමක් වන බලයලත් මිනින්දෝරු පර්සි විජයසිංහ විසින් සාදන ලද 2015.01.18 දිනැති අංක 09/2015 සැලැස්මේ නිරූපණය වන ලොට් ඒ නමැති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස පර්චස් දහතුනක් (අ.0, රූ.0, පර්.13.0) නොහොත් හෙක්ටයාර 0.03288 ක් විශාල බිම, ගස්, වගා, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

අංක 11/2010 සැලැස්මේ නිරූපණය වන ලොට් 8 ලකුණු කළ ඉඩම උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමග.

ඉහත සඳහන් දේපළ 2018 ඔක්තෝබර් මස 05 වැනි දින පෙරවරු 10.30 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම - දංගෙදර මංසන්ධියෙන් සිට ස්ටීල් පාර ඔස්සේ මීටර් 100ක් පමණ ඉදිරියට ගොස් දකුණුපසට ඇති මල්වත්ත පන්සල පාරට හැරී තවත් මීටර් 100ක් පමණ ගිය විට වම්පසින් ඇති මාර්ගයට හැරෙන්න. එම මාර්ගය දිගේ තවත් මද දුරක් ගිය විට අදාළ දේපළ මාර්ගයේ දකුණුපසින් පිහිටා ඇත.

2 වන වෙන්දේසිය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ ගාල්ල මහ නගර සභා සීමාව තුළ දංගෙදර - නැගෙනහිර 97ඩී ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ දංගොදර පිහිටි බලයලත් මිනින්දෝරු පර්සි විජයසිංහ විසින් සාදන ලද 2015.07.24 දිනැති අංක 88/2015 සැලැස්මේ නිරූපණය වන එගොඩතුඩුවේ වත්ත හෙවත් කැබැල්ලගහවත්ත 7ඒ අමුකනත්තේවත්ත අද්දර ඕවිට හෙවත් මහදූව අද්දර කැකුලන් ඕවිට ලොට් ඒ සහ මහදූව අද්දර ඕවිට ලොට් ඒ නැමති යාව පිහිටි ඉඩම් කැබලිවල ලොට් ඒක්ස් ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස පර්චස් දහහතයි දශම දෙකයි අටක් (අ.0, රූ,0, පර්.17.28) නොහොත් හෙක්ටයාර් 0.0437ක් විශාල බිම, ගස්, වගා, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් දේපළ 2018 ඔක්තෝබර් මස 05 වැනි දින පෙරවරු 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම - දංගෙදර මංසන්ධියේ සිට හිරිඹුර පාර ඔස්සේ මීටර් 400ක් පමණ ගිය විට අදාළ දේපළ මාර්ගයේ දකුණුපසින් පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම - රජයේ ගැසට් පත්‍රයේ 2018.05.25 වැනි දින පළවී ඇති අතර, ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2018.05.28 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2018.05.25 වැනි දින පළවී ඇත.

ගෙවීමේ ක්‍රමය.- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය. :-

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්),
4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000.00,
5. ලිපිකරුගේ හා සෝෂක වේතන රු. 1,000.00,
6. සියලුම ප්‍රචාරක වියදම්.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක්වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු යි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10%ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ප්‍රධාන කළමනාකාරිණිය, නීති, සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාළු පාර, කොළඹ 03. දුරකතන අංක : 011 2456481 2456478.

ඉහත සදහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

තුසිත් කරුණාරත්න (සාම විනිසුරු).
බලයලත් වෙන්දේසිකරු
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකතන අංක : 011-3068185, 011-2572940.

09-374

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීමයි.

ණය අංකය :- 01/503/01/01847/PO1/587.

1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබුවා වූද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2013.09.27 වැනි දින ගැසට් පත්‍රයේ සහ 2014.06.24 වැනි දින දිනමිණ පුවත්පතෙහි පළ කරනු ලැබුවා වූද යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ පන්නිපිටිය, හයිලේවල් පාර, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2018.10.05 වැනි දින පෙ.ව. 10.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේදී විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ, පිළියන්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කැස්බෑව නගර සභා සීමාවට අයත් මාවිත්තර උතුර ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ වරිපනම් අංක 410, කොට්ටාව, දූවවත්ත පාර, මාවිත්තර පිහිටි "මහගොඩපරගහවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ලාල් ගුණසේකර මහතා විසින් මැන සකසන ලද 2002.10.31 දිනැති අංක 8892 ඒ දරන මිනුම් පිඹුරට අනුව කැබලි අංක 01 ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අක්.0, රූඩ්.0, පර්.20ක බිම් කොටස හා ඒ මත පිහිටි ගොඩනැගිලි ඇතුළු සියලු දේත් සමග වේ.

මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක එම් 3209/07හි ලියාපදිංචි වී ඇත.

ඩබ්ලිව්. එම්. දයාසිංහ,
සාමාන්‍යාධිකාරී.

අංක 269,
ගාළු පාර, කොළඹ 03,
2018 අගෝස්තු 31 වැනි දින.

09-399

---

## යූනියන් බැන්ක් ඔෆ් කළම්බෝ පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

### උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළේ, පිටබැද්දර ප්‍රාදේශීය සභා සීමාවේ, පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර රඹුකන ග්‍රාම නිළධාරි වසමේ, රඹුකන පිහිටි මෝදරවිලහේන නමැති ඉඩමට මාතර බලයලත් මිනින්දෝරු ඩී. යූ. අබේගුණවර්ධන විසින් මැන සාදන ලද අංක 4491 සහ 2012.09.09 වැනි දින දරන පිඹුර ප්‍රකාර (කැබලි අංක A දරන බිම් කොටසේ යාබද ඉඩම් කැබලි අංක 11 සහ 12 දරන බිම් කොටස්වල ඒකාබද්ධ කිරීමක් වන බලයලත් මිනින්දෝරු ඩී. යූ. අබේගුණවර්ධන විසින් මැන සාදන ලද අංක 994 සහ 1994.02.21 වැනි දින දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 1 දරන බිම් කොටසේ නැවත මැන අනුබෙදීමක් වන) කැබලි අංක 1A සහ අංක 1B දරන බෙදා වෙන්කළ බිම් කොටස්.

අක්කර පහක් (අ.5, රූ.0, පර්.0) සහ අක්කර දෙකකුත් රූඩ් දෙකයි පර්චස් විසිහතරක් (අ.2, රූ.2, පර්.24)

විශාල බිම් කොටස, එහි පස ඒ මත පිහිටි ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේත් සමග ය. මෙම දේපළ කොටපොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 159/297 සහ G 196/121 දරන වෙළුමේ සහ පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අහංගම, දික්කුඹුර, පනුගල්ගොඩවත්ත යාගල යන ස්ථානයේ පදිංචි ලලිත නුවන් වන්නිආරච්චි (මෙහි මින්මතු ඇතැම් තැනක "බන්ධනදායී" වශයෙන් හඳුන්වන) යන අය විසින් මූල්‍ය පහසුකම් ලබාගෙන ඇති බැවින් ද, එකී බන්ධනදායී විසින් මෙහි ඉහත උපලේඛනයේ සවිස්තරව දැක්වෙන දේපළ සම්බන්ධයෙන් ප්‍රසිද්ධ නොතාරිස් කීර්ති කළුආරච්චි විසින් සහතික කරන ලද අංක 4443 සහ 2015.11.02 වැනි දින දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය ලියා අත්සන් කොට තබා, ඉහත කී මූල්‍ය පහසුකම් මත ලියාපදිංචි අංක PB 676 PQ දරන යූනියන් බැන්ක් ඔෆ් කළම්බු පීඑල්සී (මෙහි මින්මතු ඇතැම් තැනක "යූනියන් බැංකුව" වශයෙන් හඳුන්වන.) වෙත අයවිය යුතු ඉහත කී මූල්‍ය පහසුකම් සහ පොලිය ගෙවීම සඳහා ඇපයක් වශයෙන් මෙහි ඉහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ, යූනියන් බැන්ක් ඔෆ් කළම්බෝ පී. එල්. සී විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව.

2018 ක් වූ ඔක්තෝබර් මස 03 වැනි දිනප. ව. 1.30 ට අදාළ දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම .- මොරවක සිට නෙළුම දෙසට කිලෝමීටර් 4ක් ගමන් කරන විට තිල්වලා තේ කර්මාන්තශාලා පරිශ්‍රය හමුවන අතර එතැන් සිට මෝටර් රථ වාහන ගමන් කළ හැකි වම් අත පැත්තට වන්නට ඇති පාරේ කිලෝමීටර් 1.5 ක් ගමන් කරන විට අදාළ දේපළ පාරේ දකුණු පසට වන්නට පිහිටා ඇත.

ගෙවීම් කළ යුතු ආකාරය. - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%,
02. ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30 ක් ඇතුළත යූනියන් බැන්ක් ඔෆ් කළම්බෝ පී එල් සී හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය,
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
05. ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
05. ලිපිකරුගේ හා සෝෂකගේ වේතන රු. 1,000.00,
06. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 2,000.00

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සදහන් නිළධාරීන්ගෙන් විමසන්න .- නීති දෙපාර්තමේන්තුව, යූනියන් බැන්ක් ඔෆ් කළම්බෝ පී එල් සී, අංක 64, ගාලු පාර, කොළඹ 03. - දුරකතන - 011 2347100

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ
තක්සේරුකරුවෝ සහ උසාවි කොමසාරිස්වරු,
කොළඹ වාණිජ මහාධිකරණ සහ
දිසා අධිකරණය බලයලත් වෙන්දේසිකරුවෝ
රාජ්‍ය සහ වාණිජ බැංකු.

අංක 200, හල්ස්ඩ්‍රෝෆ් වීදිය,
කොළඹ 12,
දුරකතන 0773242954, 0112 445393, 077-3181891.

09-368

---

## ඩී එෆ් සී සී බැංකුව පී එල් සී
(ඩී එෆ් සී සී වර්ධන බැංකුව ලෙස හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අංක 1490 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරී පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා සීමාවට අයත්, පහළ කරගහමුන ග්‍රාම නිලධාරි වසමේ, මහර පහළ කරගහමුන පිහිටි මිල්ලගහවත්ත හෙවත් තුන්හවුල්කුරුදුවත්ත ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු H M S පෙරේරා විසින් සාදන ලද 2012 මැයි මස 08 වැනි දිනැති අංක 4543 දරන පිඹුරේ ලොට් අංක 18 ලෙස හැඳින්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන්කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය.- අක්.00, රූඩ් 00, පර්.11.5 එහි පිහිටි ගස්වැල්, වගාවන් සහ සියල්ල සහිතව.

මෙය බලයලත් මිනින්දෝරු W B L ප්‍රනාන්දු විසින් සාදන ලද 2006 ජූලි 21 වැනි දිනැති අංක 4413 දරන පිඹුරේ නැවත මිනුමකි. පහත විස්තර කෙරෙන මාර්ග අයිතියද සමග

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරී පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා සීමාවට අයත්, පහළ කරගහමුන ග්‍රාම නිලධාරි වසමේ, මහර පහළ කරගහමුන පිහිටි මිල්ලගහවත්ත හෙවත් තුන්හවුල්කුරුදුවත්ත ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු W B L ප්‍රනාන්දු විසින් සාදන ලද 2006 ජූලි 21 වැනි දිනැති අංක 4413 දරන පිඹුරේ ලොට් අංක 26, 27 සහ 29 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන්කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය (පිළිවෙලින්) :
ලොට් අංක 26 - අක්.00 රූඩ් 00 පර්.6.7
ලොට් අංක 27 - අක්.00 රූඩ් 00 පර්.26.5
ලොට් අංක 29 - අක්.00 රූඩ් 00 පර්.7

ගම්පහ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ මාර්ගයක් ලෙස ලියාපදිංචි කර ඇත.

ප්‍රසිද්ධ නොතාරිස් P P වික්‍රමතිලක විසින් සහතික කරන ලද, 2014 දෙසැම්බර් මස 01 දිනැති අංක 1490 දරන උකස්කරය ප්‍රකාර, වත්තල පදිංචි තුෂාන්ත කුමාර කොට්ටාචි සහ ගයානි පෙරේරා කුරුකුලසූරිය විසින් ඩී එෆ් සී සී බැංකුව පී එල් සී (ඩී එෆ් සී සී වර්ධන බැංකුව පී එල් සී හි අනුප්‍රාප්තික) ට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාර ව ඉෂ්ට නොකරන ලද දේපළ ඩී එෆ් සී සී බැංකුව පී එල් සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2018 ඔක්තෝබර් මස 03 වැනි දින (බදාදා) ප.ව. 1.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ගෙවීමේ ක්‍රමය.- මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්) සහ එම කොමිස් මුදලට අදාළ සියලුම බදු,
4. රු. 110,000.00 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,000,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.00

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුව පී එල් සී හි නීති දෙපාර්තමේන්තුව අමත්තන: දුරකථන අංක 011-2371371

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/ අවලංගු කිරීමේ පුර්ණ අයිතිය බැංකුව සතුය"

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 126 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

ප්‍රධාන කාර්යාලය :
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

නගර කාර්යාලය :
6 A , ෆෙයාර්ෆීල්ඩ් ගාර්ඩන්ස්,
කොළඹ 08
දුරකථන අංක : 011-2671467, 011- 2671468
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2671469
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

09 - 250

---

## මහජන බැංකුව - අක්වෙරළ බැංකු ඒකකය

